**ලංකා බැංකුව සහ එහි පරිපාලිතයන් - 2024**

----------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා බැංකුවේ (“බැංකුව”) මූල්‍ය ප්රකාශන සහ බැංකුවේ හා එහි පරිපාලිතයන්ගේ (“සමූහය”) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 5 (1) වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව 1992 මැයි 14 වන දින අංක 715 දරන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති මුදල් අමාත්‍යවරයාගේ නියෝගයක් මගින් 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ සඳහන් විධිවිධානවලින් බැංකුව නිදහස් කර ඇත. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදි.

මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
බැංකුවේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත මාගේ නිගමන පදනම් වී ඇත. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව බැංකුව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව බැංකුව කටයුතු කර ඇති බව,

- බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | **මූල්‍ය ප්‍රකාශන වලට අදාළ වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර** | | |
| අ | එක්සෙල් මගින් අතින් ඒකාබද්ධ කරන ලද වෙනම පොදු ලේජර හතරක් (DBU, FCBU, මාලදිවයින සහ අනෙකුත් විදේශීය ශාඛා) සහිතව බැංකුව සතුව සංකීර්ණ, ඛණ්ඩනය වූ පොදු ලේජර පද්ධතියක් ඇති අතර අවසාන සංඛ්‍යා නිර්මාණය කිරීම සඳහා ලෙජර් ශේෂයන්ට ගැලපීම් විශාල සංඛ්‍යාවක් අතින් සිදු කරනු ලබයි. | තවදුරටත් වැඩිදියුණු කිරීම් සඳහා නිරීක්ෂණය සටහන් කර ගන්නා ලදි. බැංකුව පවතින ක්‍රියා පටිපාටිය විධිමත් කිරීමට කටයුතු කරමින් සිටී. | අතින් සිදුකරනු ලබන ගැලපීම් අවම කිරීමට කටයුතු කළ යුතුය. |
| ආ | සියලුම ශාඛාවල ශේෂයන් සඳහා ශේෂ පත්‍ර සැසඳීමේ සහ තහවුරු කිරීමේ ක්‍රියාවලිය සඳහා බැංකුවට ලේඛනගත ප්‍රතිපත්තියක් නොතිබුණි. සමහර ශේෂයන් සඳහා සැසඳීමේ ක්‍රියාවලියක් තිබුණද, නිවැරදි මූල්‍ය ප්‍රකාශන අයිතම යටතේ වර්ගීකරණය කර තිබේද යන්න තහවුරු කිරීමට වඩා ක්‍රියාවලියේ සංඛ්‍යාත්මක ශේෂයන් සැසඳීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි. | නිරීක්ෂණය සටහන් කර ගන්නා ලදි. මෙය 2025 දෙසැම්බර් 31 වන විට අවශ්‍ය පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ ක්‍රියාවලියට හෝ පොදු ලේජර හිමිකාරිත්ව ලේඛනයට ඇතුළත් කරනු ඇත. | සියලුම ශේෂයන් සඳහා ශේෂ පත්‍ර සැසඳීමේ සහ තහවුරු කිරීමේ ක්‍රියාවලිය සඳහා ලේඛනගත ප්‍රතිපත්තියක් තිබිය යුතුය. |
| ඇ | පොදු ලේජර ගිණුම් හිමිකාරිත්වය පිළිබඳ ලේඛණගත කිරීමක් නොමැති වීම.<br>පොදු ලේජර ගිණුම් සහ මූල්‍ය ප්‍රකාශන සටහන් සහ හෙළිදරව් කිරීම් සම්බන්ධයෙන් බැංකුව සතුව ලේඛනගත හිමිකරුවන්ගේ ලැයිස්තුවක් නොතිබුණි. කළමනාකාරිත්වය විසින් අදාළ සටහන්වල භාරකරුවන් (සකස් කරන්නා සහ අනුමත කරන්නා යන දෙදෙනාම) හඳුනා ගැනීම අත්‍යවශ්‍ය වේ. | නිරීක්ෂණය සටහන් කර ගන්නා ලදි.<br>පොදු ලේජර හිමිකාරීත්වය ලේඛණගත කිරීම සිදුකරමින් පවතී. මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ ක්‍රියා පටිපාටි අත්පොත ද 2026 මාර්තු 31 වන විට යාවත්කාලීන කරනු ඇත. | පොදු ලේජර හිමිකාරිත්ව ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| ඈ | පොදු ලේජරයේ හි අතින් සිදු කරනු ලබන සටහන් සඳහා මධ්‍යම අධීක්ෂණ ක්‍රියාවලීන් නොමැති වීම.<br>ශාඛා මට්ටමින් පොදු ලේජර ගිණුම්වලට ඉහළ රුපියල් අගයන්ගෙන් සමන්විත විශාල ප්‍රමාණයේ සටහන් අතින් සිදු කරනු ලබන අතර මෙම අතින් සිදු කරනු ලබන සටහන් සඳහා මධ්‍යම අධීක්ෂණ ක්‍රියාවලියක් නොතිබුණි. | ශාඛාව විසින් අතින් සිදු කරනු ලබන සටහන් සඳහා අදාළ ශාඛා කළමනාකරුගෙන් සෑම මාසයකම අවසානයේදී තහවුරු කිරීමක් ලබා ගැනීම සඳහා යාන්ත්‍රණයක් සංවර්ධනය කරනු ඇත. ඊට අමතරව, ශාඛා අභ්‍යන්තර පාලන නිළධාරීන් වෙත ඔවුන්ගේ දෛනික කටයුතුවල කොටසක් ලෙස අතින් සිදු කරනු ලබන සටහන් පරීක්ෂා කිරීමට උපදෙස් දෙන ලදි. | අතින් සිදු කරනු ලබන සටහන් සඳහා මධ්‍යම අධීක්ෂණ ක්‍රියාවලියක් හඳුන්වා දීමට කටයුතු කළ යුතුය. |
| ඉ | ශාඛා හරහා පොදු ලේජර ගිණුමට අතින් සිදු කරනු ලබන සටහන් සඳහා නිසි සීමාවන් නොමැති වීම.<br>අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමෙන් තොරව එක් ශාඛාවකට තවත් ශාඛාවක් සඳහා පොදු ලේජරයට සටහන් අතින් ඇතුළත් කිරීමට හැකියාව ඇත, | ව්‍යාපාරික හේතුවක් නිසා පවතින වරප්‍රසාදය නතර කළ නොහැක.<br>ශාඛාව විසින් අතින් සිදු කරනු ලබන සටහන් සඳහා අදාළ ශාඛා කළමනාකරුගෙන් සෑම මාසයකම අවසානයේදී තහවුරු කිරීමක් ලබා ගැනීම සඳහා යාන්ත්‍රණයක් සංවර්ධනය කරනු ඇත. ඊට අමතරව, ශාඛා අභ්‍යන්තර පාලන නිළධාරීන් වෙත ඔවුන්ගේ දෛනික කටයුතුවල කොටසක් ලෙස අතින් සිදු කරනු ලබන සටහන් පරීක්ෂා කිරීමට උපදෙස් දෙන ලදි. | අතින් සිදු කරනු ලබන සටහන් සඳහා මධ්යම අධීක්ෂණ ක්‍රියාවලියක් හඳුන්වා දීමට කටයුතු කළ යුතුය. |
| ඊ | අවදානම් කළමනාකරණය සඳහා කණ්ඩායම් මට්ටමේ හෙළිදරව් කිරීම් අනාවරණය නොකිරීම<br>බැංකුව විසින් බැංකුවට අදාළ අවදානම් කළමනාකරණය සහ සාධාරණ වටිනාකම් හෙළිදරව් කිරීම් පමණක් සිදු කර ඇති අතර, කණ්ඩායම් මට්ටමට අදාළ එවැනි හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි. | හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය ඒ අනුව සංවර්ධනය කරනු ඇත. අවදානම් කළමනාකරණයට අදාළ ප්‍රමාණාත්මක හෙළිදරව් කිරීම් 2025.12.31 වන විට කණ්ඩායම් මට්ටමින් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. | අදාළ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමට සහ අදාළ හෙළිදරව් කිරීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | **හානිකරණය ඇතුළුව ණය සහ අත්තිකාරම් සම්බන්ධයෙන් වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර**<br>ප්‍රතිව්‍යුහගත ණය පහසුකම් හඳුනා ගැනීම | | |
| අ | හිඟ මුදල් සහිත ණය පහසුකමක් බැංකුව ප්‍රතිව්‍යුහගත කළ විට, නව පහසුකම සඳහා හිඟ දින ගණන බැංකුව ඉදිරියට ගෙන ගොස් නොතිබුණි. හොඳම පරිචයට අනුව, ප්‍රතිව්‍යුහගත පහසුකම් සඳහා හිඟ දින ගණන බැංකුව ඉදිරියට ගෙන යා යුතුය. | සටහන් කර ගන්නා ලදි.<br>පහසුකමේ අදාළ අවධිය නියමිත දින ඉක්මවීම මත පදනම්ව අර්ථ දක්වා ඇත. පහසුකම් ප්‍රතිව්‍යුහගත කරන විට, ප්‍රතිව්‍යුහගත කිරීමට පෙර, මුල් පහසුකමේ හිඟ තත්ත්වය සැලකිල්ලට ගනිමින්, ප්‍රතිව්‍යුහගත පහසුකම යම් කාල පරිච්ඡේදයක් සඳහා (නිරීක්ෂණ කාල සීමාව) අදාළ අදියරෙහි | හොඳම පරිචය අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | තබනු ලැබේ. නිරීක්ෂණ කාල සීමාවෙන් පසු, එකඟ වූ නියමයන්ට අනුව පහසුකම ආපසු ගෙවීම මත පදනම්ව, පහසුකම නැවත වර්ගීකරණය කළ හැකිය. | |
| ආ | ණය වෙනස් කිරීම සඳහා ස්වාධීන වලංගුකරණ ක්‍රියාවලියක් නොමැති වීම.<br>ණය වෙනස් කිරීම සඳහා ස්වාධීන වලංගුකරණ ක්‍රියාවලිය සඳහා බැංකුවට ප්‍රමාණවත් යාන්ත්‍රණයක් නොතිබුණි. ව්‍යාපාරික හේතූන් මත පදනම්ව, ණය පිරිහීමේ සලකුණු පෙන්නුම් කරන සමහර නිරාවරණයන් අදියර 1 (ක්‍රියාකාරී) පහසුකම් ලෙස වර්ගීකරණය කර තිබුණි. | මෙම කාර්යය සඳහා ශාඛා අභ්‍යන්තර පාලන නිළධාරීන්ගේ සහාය ඇතිව ණය වෙනස් කිරීම සඳහා ස්වාධීන වලංගුකරණ ක්‍රියාවලියක් ලබා ගැනීම සඳහා යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීමේ හැකියාව බැංකුව විසින් ගවේෂණය කරනු ඇත. | ණය වෙනස් කිරීම සඳහා ස්වාධීන වලංගුකරණ ක්‍රියාවලියක් හඳුන්වා දීමට කටයුතු කළ යුතුය. |
| (iii) | **ණය පහසුකම්වල අදියර උසස් කිරීමට අදාළව වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර** | | |
| අ | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2021 අංක 13 දරන බැංකු පනත් නියෝගයේ 11.1.2 ඡේදය අනුව ප්‍රතිලේඛණගත කරන ලද සහ ප්‍රතිව්‍යුහගත කරන ලද පහසුකම් උසස් කිරීම සිදු කිරීමට බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට පමණක් අවසර ලැබේ. විගණනයේදී**,** සාමූහික හානිකරණ ආකෘතිය යටතේ ආවරණය වන ප්‍රතිව්‍යුහගත කරන ලද සහ ප්‍රතිලේඛණගත කරන ලද ණය පහසුකම්වල අදියර උසස් කිරීම සඳහා බැංකුව විසින් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා නොගන්නා බව නිරීක්ෂණය විය. | නිරීක්ෂණය සටහන් කර ගන්නා ලදී.<br>සාමූහික හානිකරණය යටතේ ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම සහ ප්‍රතිලේඛණගත කිරීම උසස් කිරීමේ අරමුණ සඳහා ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ භාවිතා වන ආකෘතියක්/යාන්ත්‍රණයක් පවතී. අදාළ නිල උපදෙස් චක්‍රලේඛ අංක 60/2021 හි දක්වා ඇති විෂය බද්ධ නිර්ණායකයන්ට එය අනුකූලද යන්න ස්වාධීනව සත්‍යාපනය කිරීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියෝගවලට අනුකූල වීමට කටයුතු කළ යුතුය. |
| (iv) | **දත්ත ගබඩාවක් නොමැතිවීම.**<br>මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා බැංකුවට දෙපාර්තමේන්තු කිහිපයකින් දත්ත ලබා ගැනීමට සිදුවන අතර දත්ත ලබා ගැනීම සඳහා තනි දත්ත මධ්‍යස්ථානයක් නොතිබුණි. | බැංකුවේ කළමනාකාරිත්වය විසින් මධ්‍යගත ව්‍යවසාය දත්ත ගබඩාවක් පිහිටුවීමට අනුමැතිය ලබා දී ඇති අතර, ඒ සඳහා සූදානම් කිරීමේ කටයුතු දැනට සිදුකරමින් පවතී. මෙය 2025.12.31 වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. | මධ්‍යගත දත්ත ගබඩාවක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (v) | **අන්තර් ශාඛා ශේෂයන් සැසඳීම සඳහා ස්වයංක්‍රීය ක්‍රියාවලියක් නොමැති වීම.**<br><br>එක් එක් ශාඛාව සඳහා වෙනම වැඩ පත්‍රිකා පවත්වාගෙන යමින් බැංකුව දැනට දෘඩ පිටපත් ලේඛන භාවිතයෙන් අන්තර් ශාඛා ශේෂයන් සැසඳීම අතින් සිදු කරනු ලබයි. එහි ප්‍රතිඵලයක් ලෙස, විගණනය කරන අවස්ථාවේදී, බැංකුවට සමස්ත බැංකුව සඳහා අන්තර් ශාඛා ශේෂයන් පිළිබඳ ඒකාබද්ධ සැසඳීමක් සැපයීමට නොහැකි විය. තවද, සිදු කරන ලද අන්තර් ශාඛා ශේෂ සැසඳීම් සඳහා විධිමත් සමාලෝචන ක්‍රියාවලියක් නොමැති බව නිරීක්ෂණය විය. ස්වාධීන සමාලෝචනයක් නොමැතිකම සමඟ ස්වයංක්‍රීය හා මධ්‍යගත සැසඳීම් ක්‍රියාවලියක් නොමැතිකම හේතුවෙන් මූල්‍ය වාර්තාවල වැරදි, ප්‍රමාදයන් සහ විභව වැරදි ප්‍රකාශනවල අවදානම වැඩි කරයි. | "මධ්‍යම කාර්යාලය අපගේ ගිණුම/අන්තර් ශාඛා ගිණුම" අත්හිටුවීමේ හැකියාව දැනට සලකා බලමින් පවතින අතර, මේ සම්බන්ධයෙන් සාකච්ඡා සිදුකරමින් පවතී. අත්හිටුවීම කළ නොහැකි අවස්ථාවක, "මධ්‍යම කාර්යාලය අපගේ ගිණුම/අන්තර් ශාඛා ගිණුම" ස්වයංක්‍රීය කිරීමේ ක්‍රියාවලිය 2025 වසර තුළ ආරම්භ කරනු ඇත. | සිදු කරන ලද අන්තර් ශාඛා ශේෂ සැසඳීම් සඳහා විගණනයට අදාළ තොරතුරු සැපයීමට සහ විධිමත් සමාලෝචන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (vi) | **හානිකරණ ප්‍රතිපාදන ගණනය කිරීම සඳහා භාවිතා කරන පද්ධතියේ හඳුනාගත් අඩුපාඩු**<br>පද්ධතියේ ඇති ගැටළු හේතුවෙන් රු. මිලියන 271 ක ණය ගිවිසුම් 283 ක් 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය වෙනුවෙන් තනි සහ සාමූහික හානිකරණ ගණනය කිරීම් සඳහා සලකා බලා නොතිබුණි. බැංකුව මෙම ගණනය කිරීම් වෙනම පද්ධතියක් හරහා ස්වයංක්‍රීය කර ඇත. කෙසේ වෙතත්, ඉහත සඳහන් කළ ගැටළු සහ පෙර වර්ෂයේ නිරීක්ෂණ හේතුවෙන්, බැංකුව විසින් ඉහළ සංකීර්ණතාවයකින් යුත් මෙම ගණනය කිරීම් අතින් සිදු කර තිබුණි. | නිරීක්ෂණය සටහන් කර ගන්නා ලදි.<br><br>ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය වන තුරු මෙය අතින් හැසිරවිය යුතුය. කෙසේ වෙතත්, සියලුම ණය ගිවිසුම් ග්‍රහණය කර ගන්නා බව සහතික කිරීම සඳහා අතින් සිදු කරනු ලබන සත්‍යාපනය ස්ථාපිත කර ඇත.<br><br>2025.12.31 වන විට ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලිය සමඟ වැඩිදියුණු කිරීම් සිදු කරනු ඇත. | මෙම ගැටළුව නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (vii) | **අන්තර් ශාඛා පොදු ලේජර ගිණුම්**<br>ශාඛා විසින් ඔවුන්ගේ අදාළ පිරිවැය මධ්‍යස්ථාන යටතේ ඇති ඔවුන්ගේ අන්තර් බැංකු ගිණුම් සහ "මධ්‍යම කාර්යාලය - අපගේ ගිණුම" අතර වෙනස්කම් සැසඳීමට අවශ්‍ය බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.<br>• සමහර ශාඛා ඇතැම් මාස සඳහා සැසඳීම සිදු කර නොමැත.<br>• සැසඳීම ප්‍රමාද වීම හේතුවෙන් නොගලපන ලද ශේෂයන් බහු කාල පරිච්ඡේද පුරා පැවතුනි.<br>කාලීන සැසඳීමක් නොමැතිකම මූල්‍ය | නිරීක්ෂණය සටහන් කර ගන්නා ලදි.<br>වැරදි අවදානම අවම කිරීම සඳහා, "මධ්‍යම කාර්යාලය අපගේ ගිණුම" අත්හිටුවීමේ හැකියාව දැනට සලකා බලමින් පවතින අතර, මේ සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වමින් පවතී. මේ අතරතුර, මාසික සිහි කැඳවීමේ ලිපි සහ ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිතිපතා ලබා දෙනු ලබන පසු විපරම් ඇමතුම් හරහා ශාඛාවල සැසඳීම් ප්‍රකාශන කඩිනමින් ඉදිරිපත් කරන ලෙස | අන්තර් ශාඛා පොදු ලේජර ගිණුම් නිසි ලෙස සැසඳීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වාර්තාකරණයේ වැරදි, වැරදි ප්‍රකාශන සහ නොගැලපූ වෙනස්කම් ඇතිවීමේ අවදානම වැඩි කරයි. | සියලුම ශාඛා වෙත උපදෙස් දෙනු ලබයි. | |
| (viii)<br>අ | **ක්‍රෙඩිට් කාඩ්පත් මෙහෙයුම්**<br>සංචාරක කාඩ්පත්<br>සංචාරක කාඩ්පත්වලට අදාළව අංක 22312015 දරන පොදු ලෙජර් ගිණුම සඳහා බැංකුව විසින් ප්‍රමාණවත් සැසඳීමක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. නිසි සැසඳීමක් නොමැතිකම මෙම ගිණුම හා සම්බන්ධ මූල්‍ය වාර්තාවල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය පිළිබඳ ගැටළු මතු කරයි. | සංචාරක කාඩ්පත් කළමනාකරණ පද්ධතිය බැංකුවේ අභ්‍යන්තර ගිණුම්කරණ පද්ධතිය සහ පොදු ලෙජර් සමඟ සම්බන්ධ නොවන ක්ලවුඩ් මත පදනම් වූ පද්ධතියක් වේ. එබැවින්, සංචාරක කාඩ්පත්වලට අදාළ අංක 22312015 දරන පොදු ලේජර ගිණුම සැසඳීම සඳහා අප විසින් අතින් සිදු කරනු ලබන ක්‍රියාවලියක් අනුගමනය කරයි. මෙහි ඉදිරිපත් කර ඇති උපලේඛණ සංචාරක කාඩ්පත් කළමනාකරණ පද්ධතියේ සහ පොදු ලෙජර ගිණුමේ ඇති සංඛ්‍යා සැසඳීමට පමණක් භාවිතා කරයි.<br><br>ආයතනික කළමනාකරණ කමිටුවේ අනුමැතිය ඇතිව, සැසඳීම් ක්‍රියාවලියේ ස්වයංක්‍රීයකරණය දැනටමත් ආරම්භ කර ඇති අතර ව්‍යාපෘතිය 2026 අප්‍රේල් 30 වන දිනට පෙර අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. | අදාළ පොදු ලේජර ගිණුම සැසඳීමට කටයුතු කළ යුතුය. |
| ආ | පොදු විද්‍යුත් මුදල් හුවමාරු කිරීමේ පහසුකම සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සැසඳීම් ක්‍රියාවලියේ හඳුනාගෙන ඇති සැලකිය යුතු අඩුපාඩු<br><br>ලංකා පේ හරහා සිදු කරන ලද පොදු විද්‍යුත් මුදල් හුවමාරු කිරීමේ පහසුකම සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ගනුදෙනු සඳහා නිසි සැසඳීම් ක්‍රියාවලියක් නොතිබුණි. ඒ අනුව, 2024 දෙසැම්බර් 31 වන දිනට, පොදු ලෙජර් ගිණුම් 04 ක් සහ පොදු විද්‍යුත් මුදල් හුවමාරු කිරීමේ පහසුකම් ගනුදෙනුවලට අදාළ සැසඳීම් ලේඛන අතර රු. මිලියන 597 ක වෙනසක් හඳුනාගෙන තිබූ අතර, පොදු ලෙජර් ගිණුම් 04 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ගනුදෙනුවලට අදාළ සැසඳීම් ලේඛන අතර රු. මිලියන 52.7 ක වෙනසක් හඳුනාගෙන තිබුණි. නිසි | නව පොදු විද්‍යුත් මුදල් හුවමාරු කිරීමේ පහසුකම ස්විචය ක්‍රියාත්මක කිරීමත් සමඟ ස්වයංක්‍රීය සැසඳීම් මොඩියුලයක් ක්‍රියාත්මක කරනු ඇත.<br><br>ගනුදෙනු අත්පත් කරගන්නාගේ සැසඳීම් සම්පූර්ණ කරමින් පවතින අතර ව්‍යාපාරික කණ්ඩායමට පියවීමේ ප්‍රවේශය සොයා ගැනීමට හැකි වේ.<br><br>ව්‍යතිරේක අයිතම හඳුනා ගැනීම සහ ප්‍රවේශ ස්වයංක්‍රීයකරණය සංවර්ධනය කරමින් පවතී.<br>නිකුත් කරන්නාගේ සැසඳීම් සංවර්ධනය කරමින් පවතින අතර පොදු විද්‍යුත් මුදල් හුවමාරු | පොදු විද්‍යුත් මුදල් හුවමාරු කිරීමේ පහසුකම සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සැසඳීම් ක්‍රියාවලිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෛනික සැසඳීම් ක්‍රියාවලියක් නොමැතිකම අභ්‍යන්තර වංචා සහ වැරදි සඳහා සැලකිය යුතු අවදානමක් ඇති කරන අතර එමඟින් බැංකුවේ කීර්තිනාමයට හානි විය හැකිය. | කිරීමේ පහසුකම නිකුත් කරන්නා ක්‍රියාත්මක කිරීමට අනුකූලව සජීවීව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. | |
| ඇ | ක්‍රෙඩිට් කාඩ්පත්<br>ක්‍රෙඩිට් කාඩ්පත් දෛනික ශේෂ චලන වාර්තාව 2021 අප්‍රේල් මාසයේ සිට ශේෂය බින්දුව ලෙස වැරදි ආරම්භක ශේෂයක් පිළිබිඹු කරමින් පවතින අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වාර්තා වූ ශේෂයන්හි අඛණ්ඩ විෂමතාවයක් පවතුනි. මෙම ගැටළුව අද දක්වා නිවැරදි කර නොමැති අතර, ඇස්තමේන්තුගත මූල්‍ය බලපෑම ආසන්න වශයෙන් රු. බිලියන 5 ක් වේ. විසඳුමක් ලෙස, විෂමතාවය සඳහා ගිණුම්ගත කිරීමට වාර්තා වන ශේෂය ගලපමින් දෛනික කළඹ සැසඳීම් අතින් සිදු කරනු ලබයි. | නිරීක්ෂණය සටහන් කර ගන්නා ලදි.<br>යෙදුම් සැපයුම්කරු වන ටීඑස්වයිඑස් කාඩ් ටෙක් ලිමිටඩ් වෙතින් විසඳුමක් ලැබී ඇත. පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණයට පැච් නිකුතුව යොදවා ඇත.<br>තවත් අඩුපාඩු දක්නට ලැබෙන බැවින් යෙදුම් සැපයුම්කරු සමඟ අඛණ්ඩ සාකච්ඡාවක් සිදුකරමින් පවතී. | සැසඳීම් ක්‍රියාවලිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| ඈ | භෞතික කාඩ්පත විනාශ කිරීමට පෙර ආපසු ලබා ගන්නා ලද ක්‍රෙඩිට් කාඩ්පත්, ක්‍රෙඩිට් කාඩ්පත් කළමනාකරණ පද්ධතිය තුළ අත්හිටුවීම හෝ අවලංගු කිරීම සිදු කර නොතිබුණි. මෙය අභ්‍යන්තර වංචාවන්ට හේතු විය හැකි අතර අලුත් කිරීමේ දිනයේදී ඒවා අනවශ්‍ය ලෙස අලුත් කරනු ඇත. | සටහන් කර ගන්නා ලද අතර 2025.05.31 දිනට නිවැරදි ඇත. | භෞතික කාඩ්පත විනාශ කිරීමට පෙර ආපසු ලබා ගන්නා ලද ක්‍රෙඩිට් කාඩ්පත්, ක්‍රෙඩිට් කාඩ්පත් කළමනාකරණ පද්ධතිය තුළ අත්හිටුවීම හෝ අවලංගු කිරීම කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිගුකාලීන හිඟ ශේෂයන් නිරවුල් කිරීමට සතුටුදායක ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව, 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොළී සහනාධාර ගිණුම්වල දිගුකාලීන හිඟ ශේෂයන් නිරීක්ෂණය විය. | <u>තැන්පතු</u><br>නිරීක්ෂණයේ සඳහන් ලැබිය යුතු මුදල් පිළිබඳව බැංකුව මුදල් අමාත්‍යාංශය සමඟ අඛණ්ඩව සන්නිවේදනය කරන අතර ගෙවීම් අමාත්‍යාංශය විසින් වරින් වර සිදු කරනු ලබයි.<br>2025 වර්ෂය තුළදී ජ්‍යෙෂ්ඨ පුරවැසි තැන්පතු සඳහා ලැබිය යුතු පොලී ප්‍රතිපූරණය සඳහා රු. බිලියන 2.3 ක් ද ගෙවා ඇත. | දිගුකාලීන හිඟ ලැබිය යුතු පොලී සහනාධාර ශේෂයන් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| නිෂ්පාදන වර්ගය | පොදු ලේජර කේතය | 2024.12.31 දිනට හිඟ පොලිය (රු. 000) | ලැබිය යුතු පොලීවල වයස් විශ්ලේෂණය (රු. 000) | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | මාස 03 ට අඩු | මාස 03 - 06 අතර | මාස 06 - 12 අතර | වර්ෂ 01 - 02 අතර | වර්ෂ02 කට වැඩි |
| තැන්පතු | | | | | | | |
| විශේෂ තැන්පතු ගිණුම් සඳහා ලැබිය යුතු දිරි දීමනා පොලිය | 11310600 | 268,664 | 59,535 | 31,020 | 64,770 | 113,339 | - |
| ලැබිය යුතු දිරි ජොෂ්ඨ පුරවැසි දිරි දීමනා ප්‍රතිපූරණය | 1 310566 | 13,108,450 | - | - | - | 2,278,823 | 10,829,627 |
| ණය | | | | | | | |
| එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා | 51501021 | 501,539.30 | 64,041.67 | 71,871.61 | 26,334.03 | 222,308.40 | 116,983.59 |
| දියවර දිරිය | 51501018 | 14,953.78 | 1,746.38 | 1,952.72 | 4,574.02 | 6,680.65 | - |
| STaRR ව්‍යාපෘතිය | 51501018 | 2,654.07 | 746.11 | 888.90 | 1,019.06 | - | - |
| NCRCS | 51501006 | 439,250.29 | 240,418.11 | | 66,207.43 | 132,624.74 | - |

**ණය**

• විගණන නිෂ්කාශනයෙන් පසු "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" යටතේ වන දිගුකාලීන හිඟ ලැබිය යුතු පොලී සහනාධාර 2025/10/31 වන දින හෝ ඊට පෙර ගෙවීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමු කරනු ඇත.

• "දියවර දිරිය ණය යෝජනා ක්‍රමය" සඳහා, දිගුකාලීන කල් ඉකුත් වූ පොලී සහනාධාර ගෙවීම සම්බන්ධයෙන් සංවර්ධන බැංකු අංශයේ සහකාර සාමාන්‍යාධිකාරී විසින් ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සමඟ සාකච්ඡා කිහිපයක් පැවැත්වුවද, එයින් කිසිදු ප්‍රතිඵලයක් නොවීය. අක්‍රීය ණය සඳහා ද සහනාධාරය ගෙවීමට සිදුවන බැවින් දැනට අමාත්‍යාංශය විසින් 2022 දෙසැම්බර් මාසයේ සිට සහනාධාර ගෙවා නොමැත. 2025/02/25 වන දින, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන බැංකු සහ ශාඛා ණය මෙහෙයුම් - පරාසය 2) මෙම ගැටළුව සාකච්ඡා කිරීම සඳහා ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ ලේකම්වරයා සමඟ රැස්වීමක් ඉල්ලා ඇත. නමුත් තවමත් අමාත්‍යාංශය මේ දක්වා ලිපියට ප්‍රතිචාර දක්වා නොමැත.

• එම අමාත්‍යාංශයෙන් කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණු බැවින්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන බැංකු සහ ශාඛා ණය මෙහෙයුම් - පරාසය 2) 2025/10/24 දිනැති ලිපිය මගින් කල් ඉකුත් වූ සහනාධාර ගෙවීම වහාම ගෙවන ලෙස ඉල්ලා ඇත.

• පොලී රහිත අධ්‍යාපන ණය සඳහා පොලී සහනාධාරය 2025 ජූලි දක්වා ලැබී ඇත.

• 2024 වර්ෂයේ II IS II වාරය සඳහා NCRCS පොලී සහනාධාරය මහ බැංකුව විසින් ගෙවීමට නියමිතය.

### 1.6.2 ගෙවිය යුතු මුදල්

**විගණන නිරීක්ෂණය**

නිරවුල් කිරීම සඳහා සතුටුදායක ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව පහත සඳහන් ගෙවිය යුතු ශේෂයන් දීර්ඝ කාලයක සිට හිඟව පැවතුනි. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| පොදු ලේජර ගිණුමේ නම | පොදු ලේජර අංකය | වටිනාකම රු. | සටහන |
|---|---|---|---|
| එකතු කිරීම සඳහා යවන ලද ගාස්තු වවුචර් ලැබීම් | 22310082 | 108,082,023 | ශේෂවල වයස් විශ්ලේෂණය (පහත බලන්න) |
| ව්‍යාජ චෙක්පත් සහ වංචා සඳහා සංචිත | 22310122 | 1,755,943,419 | ශේෂවල වයස් විශ්ලේෂණය (පහත බලන්න) |
| එකතුව | | 1,864,025,442 | |

එකතු කිරීම සඳහා යවන ලද ගාස්තු වවුචර් ලැබීම් (22310082) - ශේෂවල වයස් විශ්ලේෂණය

| ශේෂය | 2024.12.31 දිනට ශේෂය (රු.) | 2023.12.31 දිනට ශේෂය (රු.) |
|---|---|---|
| වර්ෂ 5 කට වැඩි | 95,863,998 | 96,483,499 |
| වර්ෂ 2 සිට 5 දක්වා | 1,571,649 | 3,958,352 |
| වර්ෂ 1 සිට 2 දක්වා | 339,034 | 1,092,287 |
| වර්ෂ 1 කට අඩු | 10,307,342 | 25,401,803 |
| **එකතුව** | **108,082,023** | **126,935,941** |

මුළු හිඟ මුදල් ශේෂය අඩු වී ඇතත්, සමාලෝචිත වර්ෂය තුළදී දිගුකාලීන හිඟ මුදල් ශේෂයන් පියවීමෙන් තොරව පැවතුනි.

ව්‍යාජ චෙක්පත් සහ වංචා සඳහා සංචිත (22310122) - ශේෂවල වයස් විශ්ලේෂණය

| ශේෂය | 2024.12.31 දිනට ශේෂය (රු.) | 2023.12.31 දිනට ශේෂය (රු.) |
|---|---|---|
| වර්ෂ 5 කට වැඩි | 1,097,998,002.97 | 1,001,922,556.30 |
| වර්ෂ 2 සිට 5 දක්වා | 416,207,518.65 | 62,306,80 .18 |
| වර්ෂ 1 සිට 2 දක්වා | 65,729,903.20 | 476,301,676.14 |
| වර්ෂ 1 කට අඩු | 98,258,992.23 | 69,207,851.63 |
| **එකතුව** | 1,755,943,418.55 | 1,609,738,884.25 |

මුළු හිඟ ශේෂය අඩු වී ඇතත්, 2024 වර්ෂය අවසානයේ දී දිගුකාලීන හිඟ ශේෂය වැඩි වී ඇත.

**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**

<u>එකතු කිරීම සඳහා යවන ලද ගාස්තු වවුචර් ලැබීම්</u>

වසර 1-5 ක් පුරා කාලයක සිට රඳවා තබා ඇති අරමුදල් ඉල්ලමින් කිසිදු වෙළෙන්දෙකුගෙන් ඉල්ලීම් ලැබී නොමැත. තවද, අඛණ්ඩ නීතිමය ක්‍රියාමාර්ග හේතුවෙන් රඳවා ගත් මුදල් පවතී. කළමනාකාරිත්වය සමඟ කළ සාකච්ඡාවලට අනුව, නීතිමය ගැටළු හැර වෙනත් මුදල් අසම්භාව්‍ය ගිණුමට අවශෝෂණය කර ගැනීමට එකඟ විය. තවද, කාඩ්පත් මධ්‍යස්ථානයේ දිගුකාලීන හිඟ ශේෂයන් අඩු කිරීම සඳහා බැංකුව අභ්‍යන්තර ප්‍රතිපත්තියක් කෙටුම්පත් කර ඇති අතර අදහස් සහ නිෂ්කාශනය සඳහා එය අදාළ දෙපාර්තමේන්තු වෙත ලබා දී ඇත. ඒ අනුව, අවසන් කරන ලද ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ඇත.

**නිර්දේශය**

දිගුකාලීන ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

| | | |
|---|---|---|
| | | <u>ව්‍යාජ චෙක්පත් සහ වංචා සඳහා සංචිත</u><br>මෙයට ව්‍යාජ භාණ්ඩ සඳහා අදාළ ශාඛා විසින් සිදු කරන ලද ප්‍රතිපාදන ද ඇතුළත් වන අතර, අයකර ගැනීමේ ක්‍රියාවලිය අවසන් වූ පසු (රක්ෂණ හිමිකම් ලැබීම/කපා හැරීම), අදාළ ප්‍රතිපාදන ආපසු හැරවීමට පියවර ගනු ඇත.<br>අනාගත සිදුවීම් වළක්වා ගැනීමට බැංකුව විසින් වරින් වර අවශ්‍ය පියවර ගෙන ඇති අතර දිගුකාලීන හිඟ මුදල් නිෂ්කාශනයට පහසුකම් සපයයි. |

### 1.6.3 අත්තිකාරම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2024 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකා රජය සහ රජය සතු ව්‍යවසායන්ට අයත් ණය සහ අත්තිකාරම්වල මුළු හිඟ ශේෂය රු. මිලියන 966,071.52 ක් වූ අතර එය මුළු ණය සහ අත්තිකාරම්වලින් සියයට 39.66 ක් සහ බැංකුවේ මුළු වත්කම් වටිනාකමෙන් සියයට 19.37 ක් නියෝජනය කර තිබුණි. මුළු ණය සහ අත්තිකාරම්වල ප්‍රතිශතයක් ලෙස මෙම රජයේ නිරාවරණය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 1.46 කින් සුළු වශයෙන් වැඩි වී තිබුණි. | 2025.08.31 දිනට රජය සහ රජයට සතු ව්‍යවසායන්හි නිරාවරණය බැංකුවේ මුළු ණය වටිනාකමෙන් සියයට 31.99 ක් විය. කළඹ නිසි ලෙස කළමනාකරණය කිරීම පෙන්නුම් කරමින් 2024.12.31 දිනට සාපේක්ෂව එහි සියයට 7.67 ක අඩුවීමක් පෙන්නුම් කරයි.<br>ඉහළම රාජ්‍ය ව්‍යවසායන් 10 රජයේ අත්‍යවශ්‍ය සේවා සපයන්නන්ගෙන් සමන්විත වන අතර ආර්ථිකය සුමටව පවත්වාගෙන යාම සඳහා පහසුකම් සැලසීමට බැංකුව බැඳී සිටී. | ශ්‍රී ලංකා රජයේ සහ රජය සතු ව්‍යවසායන්හි ණය පහසුකම් අයකර ගැනීම් සමීපව අධීක්ෂණය කළ යුතුය. |

(ii) 2024 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකා රජය, මාර්ග සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ගුවන් සේවා සමාගම, ලංකා ඛනිජ තෙල් සංස්ථාව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම, රාජ්‍ය ඖෂධ සංස්ථාව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සහ ලංකා විදුලිබල මණ්ඩලය යන සමාගම් ඉහළම රාජ්‍ය ව්‍යවසායන් 10 ලෙස පිළිගෙන ඇත. 2024 දෙසැම්බර් 31 වන දිනට ඉහළම රාජ්‍ය ව්‍යවසායන් 10 හි සමස්ත ප්‍රාග්ධන හිඟ ශේෂය රු. මිලියන 855,639.30 ක් ලෙස වාර්තා විය. මෙය රජයට සහ රජය සතු ව්‍යවසායන්ට අයත් ණය සහ අත්තිකාරම්වල මුළු හිඟ ශේෂයෙන් සියයට 92.14 ක් නියෝජනය කරයි. එබැවින්, ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායන් දස දෙනා මත ප්‍රධාන වශයෙන් යැපීමක් නිරීක්ෂණය විය.

| ආයතනය | 2024 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන ශේෂය රු. මිලියන | සුරැකුම | සුරැකුම් වටිනාකම |
|---|---|---|---|
| ශ්‍රී ලංකා රජය (එ.ජ.ඩො පහසුකම) | 463,844.91 | සුරැකුම් රහිත | |
| මාර්ග සංවර්ධන අධිකාරිය | 115,567.80 | භාණ්ඩාගාර ඇපකරය | රු. මිලියන 148,759.33 |
| ශ්‍රී ලංකන් ගුවන් සේවය | 66,581.24 | භාණ්ඩාගාර ඇපකරය | එ.ජ.ඩො මිලියන 5 |
| | | සහන ලිපිය | රු. මිලියන 12,900 |
| | | | එ.ජ.ඩො මිලියන 100 |
| | | ශ්‍රී ලංකන් කේටරින් සමාගමේ කොටස් උකස් කිරීම | එ.ජ.ඩො මිලියන 186 |
| | | විනිමය බිල්පත සහ නැව්ගත කිරීමේ ලේඛන | |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 56,391.52 | භාණ්ඩාගාර හානි රක්ෂණය | රු. මිලියන 100,00 |
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 41,300.55 | භාණ්ඩාගාර ඇපකරය | රු. මිලියන 33,186.52 එ.ජ.ඩො මිලියන 73.07 |
| | | විනිමය බිල්පත සහ නැව්ගත | |

ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායන් 10 ම සෘජු අරමුදල් සැපයීම්වලට ඇතුළත් නොවන අතර එය ගෙවීමේ ක්‍රමයක් (ණයවර ලිපි) පමණක් වේ. පහසුකම් පියවීම් භාණ්ඩාගාරය විසින් සහතික කරනු ලබයි.

2025.06.30 දිනට රජයේ සහ රාජ්‍ය ව්‍යවසායන්හි මුළු නිරාවරණය බැංකුවේ මුළු ණය වටිනාකමෙන් සියයට 32.06 ක් නියෝජනය කරයි.

මුදල් ප්‍රවාහය සහ ආපසු ගෙවීමේ හැකියාව තක්සේරු කරමින් බැංකුව මූල්‍යමය වශයෙන් ශක්‍ය රාජ්‍ය ව්‍යවසායන් සඳහා අරමුදල් සපයයි.

ණය අවදානම අඩු කිරීම සඳහා අයකරගැනීම් පසු විපරම් කිරීමට සහ සුදුසු සීමාවන් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය.

| | | | |
|---|---|---|---|
| | | කිරීමේ ලේඛන | |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 29,357.42 | ස්ථාවර තැන්පතු/ඉතුරුම්/මුදල් ආන්තිකය ස්ථාවර තැන්පතු විනිමය බිල්පත සහ නැව්ගත කිරීමේ ලේඛන | රු. මිලියන 29.   2 |
| ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම | 25,692.05 | භාණ්ඩාගාර ඇපකරය | රු. මිලියන 50,000 |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | 21,215.92 | විනිමය බිල්පත සහ නැව්ගත කිරීමේ ලේඛන සුරැකුම් රහිත අයවැය ප්‍රතිපාදන සමඟ සහන ලිපියක් | සියයට 100 |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 19,445.14 | සුරැකුම් රහිත | |
| ලංකා විදුලිබල මණ්ඩලය | 16,242.75 | භාණ්ඩාගාර ඇපකර සහ සුරැකුම් රහිත | රු. මිලියන 4,540 |
| **එකතුව** | **855,639.30** | | |

| | | | |
|---|---|---|---|
| (iii) | පසුගිය වර්ෂ 5 ක කාලය තුළදී බැංකුවේ ඉහළම අක්‍රිය ණය ගනුදෙනුකරුවන් (NPA) 10 දෙනා විශ්ලේෂණය කරන ලද අතර, පහත සඳහන් ගනුදෙනුකරුවන් පසුගිය වර්ෂ 5 ක කාලය තුළදී බැංකුවේ ඉහළම අක්‍රිය ණය ගනුදෙනුකරුවන් ලෙස සිටි බව අනාවරණය විය. විස්තර පහත දැක්වේ. | කොවිඩ් 19 වසංගතයේ බලපෑම, සාර්ව ආර්ථික තත්ත්වයන්හි අහිතකර වෙනස්කම් සහ බදු සංශෝධන හේතුවෙන් 2019 සිට අදියර 03 සඳහා නව මාරු කිරීම් වැඩි වී ඇත. එබැවින්, බොහෝ අංශවලට ඒවායේ උපරිම ධාරිතාවයෙන් ක්‍රියා කිරීමට නොහැකි විය. ඒ සමඟම, අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, බලපත්‍රලාභී බැංකුවලට 2025.03.31 දක්වා අක්‍රීය | අනාගතයේදී ණය ලබා දීමට පෙර අයකරගැනීම් පසු විපරම් කිරීමට සහ සතුටුදායක ගනුදෙනුකරුවන් ගේ ණය ඇගයීමක් සහතික කිරීමට කටයුතු කළ යුතුය. |

| **ගනුදෙනුකරුගේ නම** | **මුළු අක්‍රිය ණය ශේෂය (රු. මිලියන) (2024/12/31)** |
|---|---|
| නාරත ඇග්‍රෝ ඉන්ඩස්ට්‍රීස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | 6,923.22 |
| දකුණු ආසියානු තාක්ෂණ ආයතනය | 5,039.62 |

| | |
|---|---|
| **සෙයි** ඉක්විප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ් | 4,894.57 |
| දෝලියා ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් | 4,864.64 |
| මිහින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | 4,815.93 |
| කේ ඩී ර්බට් ඇන්ඩ් සන්ස් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 4,654.23 |
| ඩබ්ලිව් එම් මෙන්ඩිස් ඇන්ඩ් කම්පැනි ලිමිටඩ් | 4,644,.16 |
| මල්කබානා ඉකෝ රිසෝට් ලිමිටඩ් | 4,351.14 |
| කඩුවෙල හෝල්ඩින්ග්ස් | 3,057.07 |
| හිඟුරාන ඇග්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ් | 3,005.84 |
| **එකතුව** | **46,250.42** |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව ඉහළම අක්‍රීය ණය ශේෂ 10 හි වැඩිවීම (රු.මිලියන) | 8,857.02 |
| ඉකුත් වර්ෂයට සාපේක්ෂව ඉහළම අක්‍රීය ණය ශේෂ 10 හි වැඩිවීමේ ප්‍රතිශතය (%) | 23.69% |

- 2024 දෙසැම්බර් 31 වන දිනට ඉහළම අක්‍රීය ණය ගනුදෙනුකරුවන් 10 දෙනාගේ සමස්ත ශේෂය රු. මිලියන 46,250.42 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 8,857 ක් හෙවත් සියයට 23.69 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. සමස්ත ශේෂය 2024 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ අදියර III දළ ණය සහ අත්තිකාරම්වලින් සියයට 12.41 ක් නියෝජනය කරයි.
- පසුගිය වර්ෂ පහක කාලය තුළදී 2024 දෙසැම්බර් 31 වන දිනට සමස්ත ඉහළම අක්‍රීය ණය ගනුදෙනුකරුවන් 10 දෙනාගේ ශේෂය සියයට 136.09 කින් හෙවත් රු. මිලියන 26,660.04 කින් වැඩි වී තිබුණි.

අත්තිකාරම් සඳහා පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීම අත්හිටුවීමට උපදෙස් දී තිබූ අතර, එය දේපල අත්පත් කර ගැනීම හරහා හිඟ මුදල් අයකර ගැනීමේ ක්‍රියාවලියට අහිතකර ලෙස බලපාන ලදි.

කෙසේ වෙතත්, බැංකුවේ වත්කම්වල ගුණාත්මකභාවය ශක්තිමත් කරන අතරම අදියර III හි අගය අඩු කිරීම සඳහා අයකර ගැනීමේ ආයතනික අංශය විසින් පහත සඳහන් ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරයි.

1. නිරීක්ෂණ ලැයිස්තුව/විභව ගනුදෙනුකරුවන් සහ එකඟ වූ ප්‍රතිකර්ම උපාය මාර්ග සඳහා පසු විපරම් කිරීම සම්බන්ධයෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අයකර ගැනීමේ ප්‍රතිසාධන ආයතනික අංශය) සහ අයකර ගැනීමේ කණ්ඩායම විසින් ව්‍යාපාර ඒකකවල එක් එක් සම්බන්ධතා කණ්ඩායම් සමඟ මාසිකව එකින් එක රැස්වීම් පැවැත්වීම.

2. පහත සඳහන් තොරතුරු සම්බන්ධයෙන් ණය කමිටුවට මාසිකව වාර්තා කිරීම.

• ණය ලබා දී ඇති දින සිට මාස 6 ක් ඇතුළත NPCF වෙත මාරු කරන ලද පහසුකම් පිළිබඳ විස්තර.

• ආයතනික අංශයේ නිරීක්ෂණ ලැයිස්තු සමාගම්වල ණය අවදානම අඩු කිරීම සඳහා ගත යුතු ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග.

3. එක් එක් ව්‍යාපාර ඒකකයේ ඉහළම NPCF සහ නිරීක්ෂණ ලැයිස්තු

පහසුකම් ආවරණය කරමින් ප්‍රධාන අවදානම් නිලධාරිගේ ප්‍රධානත්වයෙන් සතිපතා අක්‍රීය ණය සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

4. අඛණ්ඩ අධීක්ෂණය සහ පසු විපරම් සහතික කිරීම සඳහා පහත වර්ගීකරණය කර ඇති පරිදි එක් එක් ව්‍යාපාර ඒකකයේ ඉහළම අක්‍රීය ණය ගනුදෙනුකරුවන් සඳහා නිශ්චිත/අභිරුචිකරණය කළ අයකර ගැනීමේ සැලැස්මක් ඉදිරිපත් කිරීම.

- විභාග වෙමින් පවතින නඩු.
- ප්‍රතිව්‍යුහගත කිරීම/ප්‍රතිලේඛණගත කිරීම හරහා පුනර්ජීවනය/අයකර ගැනීම සඳහා හැකියාව ඇති ගනුදෙනුකරුවන්.

(iv) සමාලෝචිත වර්ෂය තුළදී, ගෙවීම් පැහැර හැරීම හේතුවෙන් ආයතනික ගනුදෙනුකරුවන් විසි දෙනෙකු අක්‍රීය ණය ගනුදෙනුකරුවන් ලෙස ආයතනික අයකර ගැනීමේ අංශයට මාරු කර තිබුණි. 2024 දෙසැම්බර් 31 වන දිනට සමස්ත ප්‍රාග්ධන හිඟ ශේෂය රු. මිලියන 15,195.37 ක් ලෙස සටහන් විය. එවැනි ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණනයේදී පහත නිරීක්ෂණ අනාවරණය විය.

**අ) වොයිස් ඔෆ් ඒෂියා නෙට්වර්ක් (ප්‍රයිවට්) ලිමිටඩ්**

2006 දී පිහිටුවන ලද වොයිස් ඔෆ් ඒෂියා නෙට්වර්ක් (ප්‍රයිවට්) ලිමිටඩ්, රියල් රේඩියෝ හා සියත එෆ්එම් වැනි ගුවන් විදුලි මධ්‍යස්ථාන සහ සියත ටීවී හා වර්ණම් ටීවී වැනි රූපවාහිනී නාලිකා ඇතුළු මාධ්‍ය නාලිකා ගණනාවක් ක්‍රියාත්මක කරයි. රු. මිලියන 200 ක අයිරාවක්, රු. මිලියන 70 ක කෙටිකාලීන ණයක් සහ කාලීන ණයක් සඳහා රු. මිලියන 28.5 ක ප්‍රාග්ධන කොටසක් පියවීම සඳහා 2019 නොවැම්බර් මාසයේදී සමාගමට රු. මිලියන 298.5 ක ණයක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ආපසු ගෙවීම්වල අඛණ්ඩ පැහැර හැරීම් හේතුවෙන් 2023 නොවැම්බර් මාසයේදී ණය, අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර තිබුණි. පහත නිරීක්ෂණ සිදු කරන ලදි.

1. 2018 පෙබරවාරි දිනැති තක්සේරු වාර්තාවකට අනුව රු. මිලියන 275 ක වටිනාකමකින් යුත් නිශ්චල දේපළක් මත ප්‍රාථමික උකසක් මගින් ණය සුරක්ෂිත කර තිබුණි. කෙසේ වෙතත්, 2025 ජනවාරි වන විට හිඟ ණය ශේෂය

1. වොයිස් ඔෆ් ඒෂියා නෙට්වර්ක් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත රු. මිලියන 298.5 ක ඒ දරන ප්‍රතිව්‍යුහගත ණයක් සහ රු. මිලියන 1.5 ක බී දරන ප්‍රතිලේඛණගත ණයක් ලබා දීමට සහ ප්‍රතිව්‍යුහගත කරන ලද/ ප්‍රතිලේඛණගත කරන ලද ණය සඳහා ණය අනුපාතය තීරණය කිරීමේදී පැනල්

ණය අනුමත කිරීමේ ක්‍රියාවලියේදී

| | | |
|---|---|---|
| රු. මිලියන 431.14 දක්වා වර්ධනය වී තිබූ අතර, ඇපකරයේ බලකල විකුණුම් වටිනාකම ණය, පොලිය සහ අනෙකුත් ගෙවීම් සම්පූර්ණයෙන්ම ආවරණය කිරීමට ප්‍රමාණවත් නොවන බව එයින් පෙන්නුම් කරයි. මෙම විෂමතාවය මගින් ණය අනුමත කරන අවස්ථාවේදී සුරැකුම ප්‍රමාණවත් ලෙස තක්සේරු කිරීමට අපොහොසත් වීම පෙන්වා දෙන ලදි. | තක්සේරුකරු විසින් ලබා දෙන දේපලෙහි වෙළඳපල වටිනාකමෙන් සියයට 100 ක් සලකා බැලීමට 2019.10.17 දින පැවති ණය කමිටු රැස්වීමේදී ණය කමිටුවේ අනුමැතිය ලබා ගන්නා ලදි. දේපලෙහි වටිනාකම් ඉහළ යාම සැලකිල්ලට ගනිමින් පැනල් තක්සේරුකරු විසින් ලබා දුන් දේපලෙහි වෙළඳපල වටිනාකමෙන් සියයට 100 ක් සැලකීම සලකා බලන ලදි.<br>2018 දී රු. මිලියන 490 සිට 2022 දී රු. මිලියන 575 දක්වා දේපලෙහි වටිනාකම ඉහළ ගොස් ඇත.<br>2019 න් පසු, ආර්ථික පසුබෑම හේතුවෙන්, සමාගම එකඟ වූ පරිදි ණය පහසුකම් සඳහා ගෙවීම් කර නොතිබූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රතිලේඛණගත කරන ලද කාලීන ණය සඳහා පොලිය උපචිත විය. | ගනුදෙනුකරුවන් ගේ මූල්‍ය තත්ත්වය සහ ණය සුදුසුකම් තක්සේරු කිරීම් වැඩි දියුණු කිරීම මගින් බැංකුවේ ස්ථාපිත චක්‍රලේඛ සහ මාර්ගෝපදේශවලට අනුකූලව සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීම සහ අනාගත පැහැර හැරීම් අවම කිරීම සඳහා දැඩි අධීක්ෂණ සහ පසු විපරම් යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම. බැංකුවේ අයකර ගැනීමේ උත්සාහයන් වේගවත් කිරීම සඳහා තවදුරටත් නිර්දේශ කෙරේ. |
| 2. ණය ප්‍රතිපත්තියට අනුව නියමයන් සහ කොන්දේසිවලට අනුකූල වීම සත්‍යාපනය කිරීම සඳහා අවශ්‍ය වාර්ෂික සමාලෝචන පැවැත්වීමට බැංකුව අපොහොසත් විය. තවද, ගැටළු කල්තියා හඳුනා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන ඵලදායී ණය අධීක්ෂණ පිළිවෙත් බැංකුව ක්‍රියාත්මක කර නොතිබුණි. අවසාන වශයෙන්, ණය ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති පරිදි, සමාගමේ ව්‍යාපාර ආදායමෙන් සියයට 30 ක් (පසුව සියයට 50 ක් දක්වා සංශෝධනය කරන ලදි.) එහි ආයතනික ශාඛාව හරහා ගනුදෙනු සිදු කළ යුතු බවට වන කොන්දේසිය බැංකුව බලාත්මක කර නොතිබුණි. ආයතනික ශාඛාව හරහා සිදු කරන ලද ගනුදෙනු මෙම නියමිත ප්‍රමාණයන්ට වඩා අඩු වූ අතර, එමගින් ණය ගිවිසුමේ නියමයන්ට අනුකූල නොවීම තවදුරටත් පෙන්නුම් කරයි.<br>ණය ලබා දීමේ ක්‍රියාවලියේදී අභ්‍යන්තර ප්‍රතිපත්ති, නීතිමය අවශ්‍යතා සහ අවදානම් කළමනාකරණ පිළිවෙත් පිළිපැදීමේ අඩුපාඩු වැනි සැලකිය යුතු අඩුපාඩු නිරීක්ෂණය කරන ලද අතර එමගින් ණය සම්පූර්ණයෙන්ම අයකර ගැනීමට නොහැකි | 2. සමාගමට ලබා දී ඇති පහසුකම් ප්‍රතිව්‍යුහගත කරන විට සහ පමා සහන පහසුකම් යෝජනා කරන විට සමාගමට ලබා දී ඇති පහසුකම් සමාලෝචනය කරන ලදි.<br>සමාගමට ලබා දී ඇති පහසුකම් පියවා ගැනීම සඳහා අඛණ්ඩ සිහිකැඳවීමේ ලිපි හා විද්‍යුත් පණිවිඩ යැවීම සහ ගනුදෙනුකරු සමඟ රැස්වීමක් පැවැත්වීම සිදු කරන ලදි.<br>ලංකා බැංකුව හරහා ප්‍රමාණවත් මුදල් ප්‍රවාහයක් ගනුදෙනු කරන ලෙස ඉල්ලා සිටිමින් ගනුදෙනුකරු වෙත අඛණ්ඩ | |

| | | |
|---|---|---|
| තත්වයක් ඇති වේ. මෙම අඩුපාඩු මගින් ණය ප්‍රතිපත්ති දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම, වඩා හොඳ අධීක්ෂණය සහ ණය සුරක්ෂිත කිරීමේදී වඩාත් හොඳින් සැලකිලිමත් වීමේ අවශ්‍යතාවය ඉස්මතු කරයි. | ඉල්ලීම්/සිහිකැඳවීම් යවන ලදි. කෙසේ වෙතත්, සමාගම අපගේ ගිණුම හරහා ලංකා බැංකුවේ හි අලෙවිකරණ ක්‍රියාකාරකම්වල මුදල් ප්‍රවාහය පමණක් ගනුදෙනු කරන ලදි.<br>ගෙන ඇති අයකර ගැනීමේ ක්‍රියාමාර්ග:<br>වොයිස් ඔෆ් ඒෂියා නෙට්වර්ක් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ලබා දී ඇති පහසුකම් ප්‍රතිලේඛණගත කිරීම සඳහා ණය කමිටුවේ අනුමැතිය 2025.05.02 දින ලබා ගන්නා ලද අතර ලියකියවිලි සකස් කිරීම සිදු කරමින් පවතී. | |
| **ආ) මල්කබානා ඉකෝ රිසෝට්ස් ලිමිටඩ්**<br>කොග්ගල හි තරු 5 ක සුඛෝපභෝගී නිවාඩු නිකේතනයක් ඉදිකරමින් පවුලක් විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයක් වන මල්කබානා ඉකෝ රිසෝර්ට්ස් ලිමිටඩ් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දී තිබුණි. සමාගම සතුව 2015-2017 කාලය තුළදී ලබාගත් අක්‍රීය ණය කිහිපයක් තිබූ අතර, 2025 මැයි වන විට ණය, අයිරා සහ ඇපකර ලිපියක් ඇතුළුව රු. මිලියන 4,413.63 ක සමස්ත හිඟ ශේෂයක් පැවතුනි. ප්‍රධාන වශයෙන් ස්කන්ධ දායකත්වය සපුරාලීමේ අභියෝග සහ දුර්වල මූල්‍ය කාර්ය සාධනය හේතුවෙන් වසර 10 කට වැඩි කාලයක් ප්‍රමාද වී ඇති ව්‍යාපෘතියෙන් මුදල් ප්‍රවාහයක් ජනනය කිරීමට නොහැකි වීම හේතුවෙන් සහන කාල සීමාවන් දීර්ඝ කිරීම, ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ප්‍රතිලේඛණගත කිරීම සඳහා සමාගම නැවත නැවතත් ඉල්ලීම් කර තිබුණි.<br>පහත නිරීක්ෂණ සිදු කරන ලදි. | | |
| 1. ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති පරිදි, උකස් කරන ලද දේපලවල ගිනි අවදානම්වලට එරෙහිව රක්ෂණ ආවරණය අලුත් කර ඇති බව සහතික කිරීමට බැංකුව අපොහොසත් වී තිබුණි. | 1. බැංකුවට උකස් කරන ලද දේපල සඳහා රු. 1,665,110,012 ක ගිනි රක්ෂණ ඔප්පුවක් ලබාගෙන තිබූ අතර එය 2019.12.12 දක්වා බලාත්මකව පැවතුනි. | ණය අනුමත කිරීමේ ක්‍රියාවලියේදී ගනුදෙනුකරුවන් ගේ මූල්‍ය තත්ත්වය සහ ණය සුදුසුකම් තක්සේරු කිරීම් වැඩි දියුණු කිරීම මගින් බැංකුවේ ස්ථාපිත චක්‍රලේඛ සහ මාර්ගෝපදේශවලට අනුකූලව සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන්ට |
| 2. බැංකුව සමාගමෙන් නිතිපතා විගණක වාර්තා සහ මූල්‍ය ප්‍රකාශන ලබා ගැනීම නොසලකා හැර තිබූ අතර, ණය කොන්දේසිවලට අනුව, සමාගම සියලු ව්‍යාපාරික කටයුතු නම් කරන ලද ආයතනික ගිණුම හරහා සිදු කරන බව සහතික කිරීමට බැංකුව අපොහොසත් වී තිබුණි. | 2. සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන (මල්කබානා ඉකෝ රිසෝට්ස් ලිමිටඩ් හි) 2019.03.31 දක්වා පවතින අතර 2019/20 මූල්‍ය වර්ෂය සඳහා කළමනාකරණ | |

| | | |
|---|---|---|
| | ගිණුම් පවතී. නිවාඩු නිකේතනයේ වාණිජ මෙහෙයුම් තවමත් ආරම්භ වී නොමැත. එබැවින්, ව්‍යාපාර මුදල් ප්‍රවාහ නොමැත. කෙසේ වෙතත්, නිවාඩු නිකේතනයේ ඉදිකිරීම් කාලය තුළදී සියලුම ගනුදෙනු ලංකා බැංකු ජංගම ගිණුම හරහා සිදු කරන ලදී. | ණය සහ අත්තිකාරම් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීම සහ අනාගත පැහැර හැරීම් අවම කිරීම සඳහා දැඩි අධීක්ෂණ සහ පසු විපරම් යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම. බැංකුවේ අයකර ගැනීමේ උත්සාහයන් වේගවත් කිරීම සඳහා තවදුරටත් නිර්දේශ කෙරේ. |
| 3. සමාගමේ සහ අධ්‍යක්ෂවරුන්ගේ දුර්වල ණය තත්ත්වය නොතකා, එක් අධ්‍යක්ෂවරයෙකුට ජාත්‍යන්තර ආයතනික ක්‍රෙඩිට් කාඩ්පතක් නිකුත් කර තිබුණි. බැංකුවේම ප්‍රතිපත්තිවලට අනුකූල වීමේ මෙම අඩුපාඩු, සමාගමේ අඛණ්ඩ මූල්‍ය අස්ථාවරත්වය සමඟ ඒකාබද්ධව, මල්කබානා ඉකෝ රිසෝර්ට්ස් ලිමිටඩ් වෙත ලබා දී ඇති ණය පහසුකම් කළමනාකරණය සහ අධීක්ෂණය සම්බන්ධයෙන් සැලකිය යුතු ගැටළු මතු කරයි. | 3 සදර්න් ගෲප් ටී ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්, සදර්න් ගෲප් සීටීසී ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ සදර්න් ගෲප් සිවිල් කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සහෝදර සමාගම්වල ශක්තිය මත පදනම්ව, සදර්න් ගෲප් අධ්‍යක්ෂවරයා වෙත ආයතනික ක්‍රෙඩිට් කාඩ්පත නිර්දේශ කරන ලද අතර 2023.07.13 දින ක්‍රෙඩිට් කාඩ්පත නිකුත් කරන ලදී. | |

**ඇ) කොග්ගල ගාමන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්**

1991 දී සංස්ථාගත කරන ලද සහ අපනයන කේන්ද්‍රීය ඇඟලුම් නිෂ්පාදනයේ නියැලී සිටින කොග්ගල ගාමන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත, උකස් ණයක හිඟ ශේෂය පරිවර්තනය කිරීම සඳහා 2021 දෙසැම්බර් මාසයේදී එ.ජ.ඩො මිලියන 1.58 ක ප්‍රතිලේඛණගත කාලීන ණයක් ලබා දී තිබුණි. මෙම පහසුකම සඳහා 3එම් එ.ජ.ඩො LIBOR + සියයට 4.75 ක (පාදක අගය වාර්ෂිකව සියයට 6 ක්) පොලී අනුපාතයක් ඇති අතර එය ඔස්ප්‍රේ කොලොතීන් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ආයතනික ඇපකරයක් මගින් පමණක් සුරක්ෂිත කර තිබුණි. කෙසේ වෙතත්, ආපසු ගෙවීමේ පැහැර හැරීම් හේතුවෙන්, ණය ආරම්භයේදීම එනම් 2021 දෙසැම්බර් 31 වන දින අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර තිබුණි.

පහත නිරීක්ෂණ සිදු කරන ලදී.

| | | |
|---|---|---|
| 1. ආයතනික ණය ප්‍රතිපත්ති අත්පොතට අනුකූල වීමේදී සැලකිය යුතු අඩුපාඩු නිරීක්ෂණය විය. අනිවාර්ය වාර්ෂික සමාලෝචන සහ පරීක්ෂණ (4.7.2 වගන්තිය), ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහයන් සහිත සම්පූර්ණ ණය විශ්ලේෂණයන් (4.7.5 වගන්තිය), ඇපකරුවන්ගේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන (6.1.11 වගන්තිය) සහ වාර්ෂික ණය තක්සේරු සංදේශ (5.3 වගන්තිය) පිළියෙල කර හෝ ලබාගෙන නොතිබුණි. | 1. උකස් ණය සීමාව යටතේ හිඟ මුදල් ප්‍රතිලේඛණගත කිරීම සඳහා 2021.12.31 දින මෙම පහසුකම ලබා දෙන ලදී. කර්මාන්ත ශාලාවේ මෙහෙයුම් තත්ත්වය තහවුරු කර ගැනීම සඳහා | ණය අනුමත කිරීමේ ක්‍රියාවලියේදී ගනුදෙනුකරුවන් ගේ මූල්‍ය තත්ත්වය සහ ණය සුදුසුකම් තක්සේරු කිරීම් වැඩි දියුණු කිරීම මගින් බැංකුවේ |

බැංකුව 2020.01.16 සහ 2022.03.31 යන දිනවල කර්මාන්ත ශාලාව පරීක්ෂා කර ඇත. කොවිඩ්-19 වසංගතය සහ රට තුළ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන්, එම කාලය තුළදී බැංකුවට ස්ථාන පරීක්ෂණ සිදු කිරීමට නොහැකි විය.

2023 මාර්තු මාසයේදී, ඔවුන්ගේ ගැනුම්කරු වන ඩේවිඩ් බ්‍රයිඩල්ගේ බංකොලොත්භාවය හේතුවෙන් සමාගම සිය මෙහෙයුම් වසා දමා තිබූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සමාගමේ ව්‍යාපාර සඳහා දැඩි මූල්‍ය සීමාවන් ඇති විය. මෙම පහසුකම සමාගමේ පවතින හිඟ මුදල් ප්‍රතිලේඛණගත කිරීම සඳහා ලබා දෙන ලදි. 2021.06.14 දිනැති සංදේශය යටතේ සම්පූර්ණ ණය විශ්ලේෂණය සිදු කර ඇති අතර වසර 5 ක් සඳහා ඇස්තමේන්තු මුදල් ප්‍රවාහ සංදේශයට අමුණා ඇත.

විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව 2021.06.14 දිනැති සංදේශයට අනුව පහසුකම අනුමත කරන අවස්ථාවේ දී ඇපකරුගේ මූල්‍ය විශ්ලේෂණය සිදු කර ඇත. කෙසේ වෙතත්, 2023 දී ව්‍යාපාරය වසා දැමීම හේතුවෙන් ඇපකරුවන්ගේ මූල්‍ය තත්ත්වය පසුව සමාලෝචනය කර නොමැත.

ප්‍රතිලේඛණගත කිරීමේ පහසුකම අනුමත කරන අවස්ථාවේ දී පස් කුළුණු විශ්ලේෂණයක් සිදු කර ඇත. පහසුකම 2021.12.31 දින ලබා දෙන ලද අතර

ස්ථාපිත චක්‍රලේඛ සහ මාර්ගෝපදේශවලට අනුකූලව සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීම සහ අනාගත පැහැර හැරීම් අවම කිරීම සඳහා දැඩි අධීක්ෂණ සහ පසු විපරම් යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම. බැංකුවේ අයකර ගැනීමේ උත්සාහයන් වේගවත් කිරීම සඳහා තවදුරටත් නිර්දේශ කෙරේ.

| | |
|---|---|
| | 2023 මාර්තු ව්‍යාපාර මෙහෙයුම් වසා දමන ලදි. එම කාලය තුළදී වැඩිදුර විශ්ලේෂණයක් සිදු කර නොමැත. |
| 2. ප්‍රතිපත්ති අවශ්‍යතා තිබියදීත් (4.7.6 වගන්තිය) කිසිදු ස්පර්ශ්‍ය ඇපකරයක් ලබා නොගත් බැවින්, පහසුකමට ශක්තිමත් “දෙවන මාර්ගයක් (second way out)” නොතිබුණි. | 2. සමාගමේ මූල්‍ය සීමාවන් හේතුවෙන් කාරක ප්‍රාග්ධන සීමාවන් යටතේ හිඟ මුදල් ප්‍රතිලේඛණගත කිරීමට පහසුකම ලබා දෙන ලදි. පවතින උකස් ණය පහසුකම් ඔස්ප්‍රේ ක්ලෝතින් හි ආයතනික ඇපකරය මගින් සුරක්ෂිත කරන ලද අතර ප්‍රතිලේඛණගත කරන ලද පහසුකම සඳහා එම සුරැකුමම ලබා ගන්නා ලදි. |
| 3. ප්‍රතිලේඛණගත කිරීමෙන් පසුව, මූල්‍ය කළමනාකරු විසින් සහතික කරන ලද වලංගු රක්ෂණ ආවරණයක්, මාසික තොග හා ලැබිය යුතු මුදල් ප්‍රකාශන ලබා නොගැනීම සහ බැංකුවේ නම් කරන ලද ගිණුමක් හරහා නිෂ්පාදන මුදල් ප්‍රවාහයෙන් සියයට 40 ක් ගනුදෙනු නොකිරීම වැනි ණය ගිවිසුමේ නියම කර ඇති ප්‍රධාන කොන්දේසිවලට අනුකූල වීමට සමාගම අපොහොසත් වී තිබුණි. මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණයෙන් 2022 තුළදී ස්ථාවර නොවන එකතු කිරීම් අනාවරණය වූ නමුත් 2023 මුල් භාගයේ සිට එකතු කිරීම් තියුනු ලෙස පහත වැටී තිබුණු අතර, 2023 මැයි මාසයේදී එ.ජ.ඩො 28 ක් පමණක් ලැබී තිබුණි. ඉන් පසුව ලැබීම් ශුන්‍ය විය. 2023 ජූනි සිට 2025 ජූලි දක්වා කිසිදු මුදල් ගලා ඒමක් වාර්තා වී නොතිබුණි. මේ අතර, සමාගම අධික ලෙස උත්තෝලනය කර ඇති බවත්, ස්කන්ධයට එරෙහිව අධික ණය ගැනීම් සමඟ සමාගම බංකොලොත් වීමේ අවදානමට නිරාවරණය වන බවත් CRIB වාර්තා සහ මූල්‍ය ප්‍රකාශනවලින් පෙන්නුම් කර තිබුණි. සමාගම දැන් අවසන් කිරීමේ ක්‍රියාවලියක් යටතේ පවතින අතර, 2025 මැයි 30 වන දිනට එ.ජ.ඩො මිලියන 1.47 ක හිඟ ප්‍රාග්ධන කොටස අයකර ගැනීම සහ එ.ජ.ඩො මිලියන 0.32 ක උපචිත පොලිය අයකර ගැනීම ඉතා සැක සහිත බැවින් ණය අනාරක්ෂිත ණයහිමියන් යටතේ වර්ගීකරණය කර තිබුණි. | 3. බැංකුව ස්පර්ශ්‍ය සුරැකුම්පත්වලට එරෙහිව පහසුකම් ලබා දී නොමැත. එබැවින්, බැංකුවට පක්ෂව රක්ෂණ ආවරණයක් පවරා නොමැත.<br>ඔස්ප්‍රේ ක්ලෝතින් හි ආයතනික ඇපකරයට එරෙහිව ප්‍රතිලේඛණගත පහසුකම සලකා බලන ලදි. වරින් වර සිදු කරන ලද පරීක්ෂාවකදී<br>තොග/ණයගැතියන්ගේ තත්ත්වය අධීක්ෂණය කරන ලදි.<br>සමාගම ගැනුම්කරු වන ඩේවිඩ්ස් බ්‍රයිඩල් වෙත අපනයනය කර ඇති අතර, කොවිඩ්-19 වසංගත කාලය තුළදී ගැනුම්කරුගේ ව්‍යාපාර බිඳවැටීම හේතුවෙන් සමාගමට ඇණවුම් අහිමි වී තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2003 දී ව්‍යාපාරය වසා දැමීමට සිදුවිය.<br>ගෙන ඇති අයකිරීමේ ක්‍රියාමාර්ග:<br>• 2023.12.07 දින සමාගමට, අධ්‍යක්ෂවරුන්ට |

| | | |
|---|---|---|
| | සහ ආයතනික ඇපකරුට එන්තර වාසිය ලබා දෙන ලදි.<br>• 2024.10.11 දින ඇවර කිරීමේ නියෝගය ලබා දී ඇති අතර බැංකුව විසින් ඇවරකරු වෙත දැනටමත් හිමිකම් පෑමක් ගොනු කර ඇත. ඇවරකරුගේ වාර්තාව සඳහා ඊළඟ නඩු විභාගය 2025.11.03 දින පැවැත්වේ. | |
| **3. ජයසිරි හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම**<br>2014 දී සංස්ථාගත කරන ලද ජයසිරි හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම, ඩබ්ලිව්. එම් මෙන්ඩිස් සහ සමාගමේ ප්‍රධාන ගැනුම්කරුවන් සහ බෙදාහරින්නෙකු ලෙස ක්‍රියා කරන අතර දකුණු කලාපය සඳහා බෙදාහැරීමේ අයිතිය හිමිකරගෙන සිටී. එහි සහෝදර සමාගම් වයින් සාප්පු 50 ක් ක්‍රියාත්මක කරයි. හදිසි කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා සමාගම මුලින් ඉදිරිදාතම චෙක්පත් මත රු. මිලියන 200 ක සහ දේපළ මත රු. මිලියන 100 ක අයිරා පහසුකමක් ඉල්ලා ඇත. දේපළ උකස සහිත පහසුකම අවසන් කරන තෙක්, අතුරු පදනමක් මත ඉදිරිදාතම චෙක්පත් මත රු. මිලියන 100 ක අයිරාවක් බැංකුව අනුමත කර තිබුණි. ඊට අමතරව, උත්සව සමයේදී අධ්‍යක්ෂවරුන්ගේ ඒකාබද්ධ සහ ඇපකර කිහිපයක් මත රු. මිලියන 25 ක තාවකාලික අයිරාවක් ලබා දී තිබුණි.<br>පහත නිරීක්ෂණ සිදු කරන ලදි. | | |
| 1. ඉඩම් හිමිකම් හතරක් ඉදිරිපත් කරන ලද නමුත්, අවහිරතාවයන් හේතුවෙන් නිෂ්කාශනය ලබාගෙන නොතිබුණි.<br>2. ණය ප්‍රතිපත්ති අත්පොතෙහි 8 වන වගන්තිය යටතේ අවශ්‍ය ණය අධීක්ෂණය සිදු කර නොතිබුණු අතර, පසු විපරම් කිරීම හෝ කලින් ගැටළු හඳුනා ගැනීම පිළිබඳ සාක්ෂි සඳහා කිසිදු වාර්තාවක් නොතිබුණි. | 1. සටහන් කර ගන්නා ලදී.<br>2. දිගුකාලීන ණය ගැතියන් හේතුවෙන් සමාගම ව්‍යාපාර පාඩුවලට මුහුණ දුන් අතර තත්වය අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වේගයෙන් පිරිහී ගිය අතර, ව්‍යුහගත අධීක්ෂණ වාර්තා සකස් කිරීම දුෂ්කර විය. කෙසේ වෙතත්, ජංගම ගිණුමට ප්‍රමාණවත් මුදල් ප්‍රවාහයන් යොමු කිරීම සඳහා සම්බන්ධතා ඒකකය විසින් සමාගමට සිහි කැඳවීමේ ලිපි යවා ඇත.<br>එපමණක් නොව, සම්බන්ධතා කළමනාකරු/ණය නිලධාරියා විසින් අධ්‍යක්ෂවරුන් සමඟ පියවීම් සැලසුම් පිළිබඳව | ණය අනුමත කිරීමේ ක්‍රියාවලියේදී ගනුදෙනුකරුවන් ගේ මූල්‍ය තත්ත්වය සහ ණය සුදුසුකම් තක්සේරු කිරීම් වැඩි දියුණු කිරීම මගින් බැංකුවේ ස්ථාපිත චක්‍රලේඛ සහ මාර්ගෝපදේශවලට අනුකූලව සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීම සහ අනාගත පැහැර හැරීම් අවම කිරීම සඳහා දැඩි අධීක්ෂණ සහ පසු විපරම් යාන්ත්‍රණ |

| | | |
|---|---|---|
| | නිතිපතා විධිමත් සාකච්ඡා, ශාඛා මට්ටමේ සමාලෝචන සහ පසු විපරම් සිදු කරන ලදි.<br>ගනුදෙනුකරු සමඟ අඛණ්ඩ සම්බන්ධතාවය ප්‍රායෝගිකව සිදු කරන ලදි. | ක්‍රියාත්මක කිරීම. බැංකුවේ අයකර ගැනීමේ උත්සාහයන් වේගවත් කිරීම සඳහා තවදුරටත් නිර්දේශ කෙරේ. |
| 3. සමාගම ඉඩම්, ගොඩනැගිලි, වාහන සහ රක්ෂණ ආවරණයක් ඇති බව ප්‍රකාශ කළද, මෙම වත්කම් සත්‍යාපනය කිරීම සඳහා කිසිදු ආධාරක ලේඛනයක් ඉදිරිපත් කර නොතිබුණි. පහසුකමේ කොන්දේසිවලට අනුව, එකතු කිරීම්වලින් අවම වශයෙන් සියයට 75 ක් ලංකා බැංකුවේ ගිණුම් අංක 83169689 හරහා ගනුදෙනු කළ යුතු වුවද, එය අඛණ්ඩව පිළිපැද නොතිබුණි. | **3.** බැංකුව විසින් අධ්‍යක්ෂවරුන් සතු ඉඩම්, ගොඩනැගිලි, මෝටර් රථ සහ රක්ෂණ ආවරණ ලැයිස්තුවක් ලබාගෙන ඇති අතර එම ලේඛනය ණය ගොනුවට ගොනු කර ඇත.<br>ගනුදෙනුකරුගේ සමූහය වයින් සාප්පු 50 ක් හිමි සහෝදර සමාගම් කිහිපයක් හරහා ක්‍රියාත්මක වේ. ප්‍රායෝගිකව, මෙහෙයුම් ඉල්ලුම් නිසා සුමට මුදල් ප්‍රවාහ සහ සැපයුම්කරුගේ පියවීම් සහතික කිරීම සඳහා ඔවුන් බහු ආයතන සමඟ බැංකු කටයුතු කිරීමට යොමු වේ.<br>සෘතුමය ඉල්ලුමේ උච්චාවචනයන් (විශේෂයෙන් උත්සව කාලවලදී) විවිධ ගිණුම්වලට චෙක්පත් තැන්පත් කිරීමේදී නම්‍යශීලී බවක් අවශ්‍ය විය, සමහර විට හදිසි සැපයුම්කරුගේ ගෙවීම් සපුරාලීමට හෝ සුරාබද්දු ආශ්‍රිත හිඟ මුදල් පියවීම සඳහා එය අවශ්‍ය වේ.<br>අව්‍යාජ බැංකු සම්බන්ධතාවයක් පෙන්නුම් කරමින් අනුමත ගිණුමේ සැලකිය යුතු ගනුදෙනු ගනුදෙනුකරු විසින් පවත්වා ගෙන ඇත.<br>හදිසිභාවය සහ තරඟකාරී බැංකු පරිසරය සැලකිල්ලට ගෙන, සියයට 75 වගන්තිය දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම සම්බන්ධතාවය අඩාල | |

| | | |
|---|---|---|
| | කිරීමට සහ ගනුදෙනුකරු වෙනත් බැංකුවකට යැමෙන් ගනුදෙනුකරු අහිමි වීමේ අවදානමක් ඇති කිරීමට ඉඩ තිබුණි.<br>ගිණුම හරහා චෙක්පත් වැඩිවශයෙන් ගනුදෙනු කිරීම දිරිමත් කිරීම සඳහා සේවාදායකයා සමඟ නිතිපතා සාකච්ඡා පවත්වන ලදි. | |
| (v) **වෝටර්ස් එජ් ලිමිටඩ් වෙත ලබා දී ඇති පහසුකම්**<br>බත්තරමුල්ලේ කාමර 48 කින් යුත් කුඩා පරිමාණයේ සුඛෝපභෝගී හෝටලයක් ඉදිකිරීම සඳහා රු. මිලියන 1,405.7 ක් සහ රු. මිලියන 240 ක් වටිනා කාලීන ණය පහසුකම් බැංකුව විසින් අනුමත කර ඇත. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය අර්ධ වශයෙන් පමණක් නිම කර තිබූ අතර, බිම් මහල සහ කාමර 20 ක් ක්‍රියාත්මක වේ. ඉහළ මහල සහ භෝජන සංග්‍රහ පහසුකම් නිම කර නොතිබුණි. සංශෝධිත පිරිවැය, කාලරාමු සහ ශක්‍යතාව තක්සේරු කිරීමට බැංකුවට ඇති හැකියාව සීමා කරමින් සංශෝධිත ප්‍රමාණ බිල්පත (BOQ) සහ යාවත්කාලීන කරන ලද ව්‍යාපෘති සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණි. මෙය ව්‍යාපෘතියේ ආදායම් උත්පාදන ධාරිතාවයට අහිතකර ලෙස බලපා තිබූ අතර එමඟින් ණය ගැතියාගේ ආපසු ගෙවීමේ හැකියාව දුර්වල කරයි.<br>පහත සඳහන් නිරීක්ෂණ සිදු කරන ලදි.<br>1. සමාගම විසින් මුලින් සම්පූර්ණයෙන්ම දැරීමට නියමිතව තිබූ ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යැම් මූල්‍යකරණය කිරීමෙන් බැංකුව එකඟ වූ කොන්දේසිවලින් බැහැර වී තිබුණි. නිසි ප්‍රගති වාර්තාකරණයක් නොමැතිකම සහ සමීප අධීක්ෂණයක් නොමැතිකම ව්‍යාපෘති අධීක්ෂණයේ සහ අවදානම් කළමනාකරණයේ දුර්වලතා තවදුරටත් ඉස්මතු කරයි. | 1. අයදුම්කරු පළමු මාස දොළහ සඳහා ප්‍රගති වාර්තා ඉදිරිපත් කර ඇත. ඉන්පසුව, අතුරු ගෙවීම් සහතික සහ ශාඛාව විසින් සිදු කරන ලද පරීක්ෂාවන් මගින් ප්‍රගතිය තහවුරු කරන ලදි.<br>කෙසේ වෙතත්, දැන් ගනුදෙනුකරු සංශෝධිත ප්‍රමාණ බිල්පතට (BOQ) අනුව ඉදිකිරීම් සම්පූර්ණයෙන්ම අවසන් කර ඇති අතර 2025 මැයි මාසයේදී වාණිජ මෙහෙයුම් ද ආරම්භ කර ඇත. එබැවින්, ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය සහ අරමුදල්වල අවසාන භාවිතය අනතුරට ලක්ව නොමැති බව තහවුරු වේ. | ණය අනුමත කිරීමේ ක්‍රියාවලියේදී ගනුදෙනුකරුවන් ගේ මූල්‍ය තත්ත්වය සහ ණය සුදුසුකම් තක්සේරු කිරීම් වැඩි දියුණු කිරීම මගින් බැංකුවේ ස්ථාපිත චක්‍රලේඛ සහ මාර්ගෝපදේශවලට අනුකූලව සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීම සහ අනාගත පැහැර හැරීම් අවම කිරීම සඳහා දැඩි අධීක්ෂණ සහ පසු විපරම් යාන්ත්‍රණ |

| | | |
|---|---|---|
| 2. සුරැකුම සම්බන්ධ කොන්දේසි කිහිපයක් තවමත් ඉටු නොකළ බව නිරීක්ෂණය විය, එනම්, නාගරික සංවර්ධන අධිකාරිය සහ වෝටර්ස් එජ් ලිමිටඩ් විසින් යෝජිත පහසුකම් සඳහා දේපලෙහි හිමිකම් නිරවුල් වූ පසු කල්බදු දේපල සඳහා වන කල්බදු අයිතිවාසිකම් බැංකුවට උකස් කරන බවට නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි ප්‍රතිඥා ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු වන අතර හිමිකම් සම්බන්ධ ගැටලුව මාස තුනක කාලසීමාවක් ඇතුළත විසඳිය යුතු වේ. | 2.හිමිකම් නිෂ්කාශනය කිරීමේ ක්‍රියාවලිය බැංකුව විසින් අඛණ්ඩව පසු විපරම් කරන ලද අතර නාගරික සංවර්ධන අධිකාරියේ සහ වෝටර්ස් එජ් සමාගමේ නිලධාරීන් සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී. 2021.06.03 වන දින බැංකුවේ නීති නිලධාරී විසින් ලබා දී ඇති උපදෙස් මත, 2023.10.05 දින නිවැරදි කිරීමේ ඔප්පුව ක්‍රියාත්මක කරන ලදි. ඉන් පසුව, තවදුරටත් නිවැරදි කිරීම් සඳහා, නීතිඥ මණ්ඩලය විසින් සම්බන්ධතා ඔප්පුව ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් දී ඇති අතර ලියාපදිංචි කළ සම්බන්ධතා ඔප්පුව 2025.05.27 දින අප වෙත ලැබී ඇත.<br>ඒ අනුව, නීතිඥ මණ්ඩලය විසින් 2025.07.07 දින හිමිකම් වාර්තාව බැංකුවට ඉදිරිපත් කරන ලදි. බැංකුවේ නීති නිලධාරිනිය විසින් 2025.08.18 දිනැති ඇයගේ ලිපිය මගින් ලේඛන ලබා ගැනීමට යටත්ව හිමිකම් වර්තාව පිළිගෙන ඇත.<br>අ. 2019 ජුනි 11 දිනැති අංක 11/2019 දරන රැස්වීමේ අංක 240/2019 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව.<br>ආ.2019 ජුනි 11 දින මහ නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යවරයා ලබා දී ඇති අනුමැතිය.<br>ඇ. 2018 අප්‍රේල් 03 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ 2018 මාර්තු 21 දිනැති අංක 18/0606/724/028 දරන | ක්‍රියාත්මක කිරීම. බැංකුවේ අයකර ගැනීමේ උත්සාහයන් වේගවත් කිරීම සඳහා තවදුරටත් නිර්දේශ කෙරේ. |

අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව.

ඈ. අංක 325 දරන කල්බදු ගිවිසුමේ 1.5 වගන්තියේ සඳහන් ව්‍යාපෘති සංවර්ධන සැලැස්මේ සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනේ සහතික කළ පිටපත් .

ඉ. මැතකදී ලබාගත් පළාත් පාලන ආයතන ලේඛනය.

ඊ. මැතකදී ලබාගත් සමාගම් ලේඛනවල සහතික කළ පිටපත්.

උ. කඩුවෙල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත් අංක LDO B /7/157 දරන පත්තීරුවේ සහතික කළ පිටපත.

ඌ. අංක LDO B /7/55,56,57,58 යන පත්තීරුවල සහතික කළ පිටපත්.

එ. 2365A සැලැස්මේ 13 වන ඉඩම පොදු මාර්ගයක්ද යන්න තහවුරු කරමින් නාගරික සංවර්ධන අධිකාරියේ තහවුරු කිරීම.

ඒ. අදාළ ඉඩම උස් ඉඩමක් බව තහවුරු කරමින් ගොවිජන දෙපාර්තමේන්තුවේ කොමසාරිස්ගේ තහවුරු කිරීම.

ඉහත ලියකියවිලි බැංකුවට ලද පසු, ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව පහසුකම් සුරක්ෂිත කිරීම සඳහා අදාළ උකස් බැඳුම්කරය ක්‍රියාත්මක කරනු ඇත.

3. හෝටලය අර්ධ මෙහෙයුම් ආරම්භ කළද අවශ්‍ය අනුකූලතා සහතිකය (COC) ලබාගෙන නොතිබුණි. ඊට අමතරව,

3. අර්ධ වශයෙන් නිම කරන ලද හෝටලය 2025

| | |
|---|---|
| බැංකුව විසින් දේපල සඳහා වන අවවාද අළුත් කිරීමට සහ නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට අසමත් වී තිබූ අතර, කල්බදු අයිතිවාසිකම් උකස් කිරීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය සහ වෝටර්ස් එජ් ලිමිටඩ් වෙතින් බලාත්මක කළ හැකි ප්‍රතිඥා ප්‍රකාශ වර්ෂ තුනකට පසුවත් ඉදිරිපත් කර නොතිබුණි. මෙම අඩුපාඩු නිසා බැංකුව නීතිමය, නියාමන සහ ණය අවදානම්වලට නිරාවරණය වේ. | මැයි 04 වන දින විවෘත කරන ලදි. අනුකූලතා සහතිකය (COC) ලබා ගැනීමට පෙර, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් (NBRO) සහ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාවෙන් (SLLDC) අනුමැතිය ලබා ගත යුතුය.<br>බැංකුවේ පරිචයට අනුව, COC ලැබෙන තෙක් ණය මුදලින් සියයට 5 ක් (රු. මිලියන 70.28 ක්) රඳවා ගත යුතු නමුත්, ණය මුදලින් සියයට 17.5 ක් වන රු. මිලියන 245.86 ක් අප විසින් රඳවා ගෙන ඇත.<br>2025.08.01 දින දින පොත් අංක 23802 යටතේ කඩුවෙල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට කේවියට් තහනම ඉදිරිපත් කර ඇත. |
| 4. සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වන කාමර 48 කින් යුත් හෝටලයකින් ලැබෙන ආදායම මත පදනම්ව මුල්ම ආපසු ගෙවීමේ හැකියාව තක්සේරු කර තිබුණි. කාමර 20 දක්වා පරිමාණය අඩු කිරීම හේතුවෙන්, තථ්‍ය ආදායම ඇස්තමේන්තුවලට වඩා සැලකිය යුතු ලෙස අඩු විය. 2023 මූල්‍ය ප්‍රකාශනවලින් පිළිබිඹු වන පරිදි පවතින මුදල් ප්‍රවාහයන් ණය වාරික ගෙවීමට ප්‍රමාණවත් නොවේ. මුල් අනුමැතියෙන් ඔබ්බට සහන කාලය දීර්ඝ කිරීමත් සමඟ, පහසුකම්වල ණය ගුණාත්මක භාවය පිරිහීම සහ බැංකුවේ අයකර ගැනීමේ අවදානම වැඩි වීම මෙම ගැටළුවලින් පෙන්නුම් කරයි. | 4. පහසුකම් අනුමත කරන අවස්ථාවේදී, සහන කාලය තුළදී වසරකට සියයට 8 ක පොලී අනුපාතයක් යටතේ පොලී සංරචකය රු. මිලියන 240.0 ක් ලෙස අප විසින් ඇස්තමේන්තු කර ඇත. කෙසේ වෙතත්, පොලී අනුපාත අඛණ්ඩව ඉහළ යාම හේතුවෙන්, මාස 24 ක සහන කාලයක පොලිය සපුරාලීමට රු. මිලියන 240.0 ක ණය ප්‍රමාණවත් නොවීය. එබැවින්, අයදුම්කරු 2024 ජනවාරි සිට ණය දෙකෙහිම පොලිය තමන්ගේම අරමුදල් මගින් ගෙවමින් ඇත.<br>එමෙන්ම, රට තුළ පැවති අහිතකර ආර්ථික තත්ත්වයන්, ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අවප්‍රමාණය |

වීම සහ ආනයන සීමාවන් පැනවීම සමඟ ගොඩනැගිලි ද්‍රව්‍ය සීමිත වීම හේතුවෙන්, ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල ඉහළ ගොස් ඇත. එබැවින්, ව්‍යාපෘතියේ අනපේක්ෂිත පිරිවැය ඉහළ යාම අවම කිරීම සඳහා, ව්‍යාපෘතියේ මුළු ව්‍යුහය ඇතුළුව කාමර 20 ක් ආවරණය වන පරිදි ගොඩනැගිල්ලේ මහල් දෙකක් පමණක් සම්පූර්ණ කිරීමට ගනුදෙනුකරු තීරණය කරන ලදි.

එබැවින්, ව්‍යාපෘතියේ ඉතිරි කටයුතු සාර්ථකව නිම කිරීම සඳහා, අයදුම්කරු විසින් ණය කාලය සහ සහන කාලය තවත් මාස 12 කින් දීර්ඝ කරන ලෙස ඉල්ලා සිටි අතර ඒ සඳහා 2024.06.18 දින අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමැතිය ලබාගෙන ඇත. දැන් ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නිම කර ඇති අතර 2025 මැයි මාසයේදී වාණිජ මෙහෙයුම් ආරම්භ කර ඇත.

මූලික ව්‍යාපෘතියේ විෂය පථය අඩු කිරීම හේතුවෙන්, අයදුම්කරුගේ ආපසු ගෙවීමේ ධාරිතාව තහවුරු කර ගැනීම සඳහා බැංකුව විසින් සමස්ත හෝටල් ආදායම විශ්ලේෂණය කරන ලද අතර ණය පහසුකම් සඳහා ගෙවීම් කිරීමට එය ප්‍රමාණවත් වේ.

අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ගිණුම් පරීක්ෂා කිරීමේදී, පසුගිය වර්ෂවල පිරිවැටුම වැඩි වී ඇති අතර මේ වන විට කිසිදු හිඟ මුදලකින් තොරව ගෙවීම් කරනු ලබයි.

(vi) යම් වර්ෂයකදී ණය ලබා දුන් සමහර ගනුදෙනුකරුවන්ගේ ණය ණය ලබා දී ඇති වර්ෂයේදීම අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබුණි. (ප්‍රතිලේඛණගත කළ පහසුකම් හැර). ඉහත කාණ්ඩයට අයත් ඉහළම ගනුදෙනුකරුවන් 10 දෙනා සඳහා සිදු කරන ලද විශ්ලේෂණයට අනුව, 2024 වර්ෂය තුළදී මෙම ගනුදෙනුකරුවන් 10 දෙනා සඳහා රු. මිලියන 1,118.73 ක් ලබා දී තිබූ අතර එයින් සියයට 97.1 ක් හෙවත් රු. මිලියන 1,086.29 ක් එම වර්ෂයේදීම අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර තිබූ බව නිරීක්ෂණය විය.

2024 දෙසැම්බර් 31 වන දිනට

| | ගනුදෙනුකරුගේ නම | ණය ගණන | 2024 වර්ෂය තුළදී ලබා දී ඇති මුළු මුදල (රු.මිලියන) | 2024.12.31 දිනට මුළු හිඟ මුදල (රු.මිලියන) |
|---|---|---|---|---|
| 1 | ග්ලෝබල් ට්‍රාන්ස්පෝටේෂන් ඇන්ඩ් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 2 | 785.11 | 769.49 |
| 2 | එෆ්.අයි.බී.සී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් | 11 | 107.36 | 105.  6 |
| 3 | හිඟුරාන ඇග්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ් | 16 | 81.98 | 81.22 |
| 4 | සුහද ලංකා හාඩ්වෙයාර් | 1 | 30.00 | 30.00 |
| 5 | නෝර්ත්වෙස්ට් මැරීන් ලැන්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 1 | 32.53 | 25.98 |
| 6 | කොලෙගා ඉංජිනේරු (ප්‍රයිවට්) ලිමිටඩ් | 11 | 32.52 | 25.67 |
| 7 | ගාමිණී එන්ටර්ප්‍රයිසස් | 5 | 15.33 | 14  39 |
| 8 | කිවන් ඇන්ඩ් බෙඩරූම් (ප්‍රයිවට්) ලිමිටඩ් | 1 | 14.33 | 14.33 |
| 9 | පී.ඒ.ඩී.එම් ප්‍රියශාන්ත මහතා | 2 | 10.57 | 10.5 |
| 10 | කේ.එච්.පී සමරසිංහ මහත්මිය | 1 | 9.00 | 8.83 |

**ග්ලෝබල් ට්‍රාන්ස්පෝටේෂන් ඇන්ඩ් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

පහසුකම් ප්‍රතිලේඛණගත කිරීම සඳහා ගනුදෙනුකරු සමඟ සාකච්ඡා සිදු කරමින් පවතී. මේ අතර, 2025.08.05 දින TOD පහසුකමට අදාළව ණය ගැතියාට සහ ඇපකරුවන්ට එරෙහිව උසාවියේ නඩුවක් ගොනු කරන ලදි. (නඩු අංකය CHC/101/2025/MR)

**එෆ්.අයි.බී.සී ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්**

2025.09.30 දිනට සියලුම පහසුකම් අක්‍රීය ණය වෙත මාරු කර ඇත. 2025.08.07 වන දින පහසුකම් 09 ක් සඳහා LD ලබා දී ඇත. පළාත් නීති ඒකකය විසින් අවසන් නිවේදනය සකස් කරමින් පවතී. මේ අතර ගනුදෙනුකරුගේ ඉල්ලීම පරිදි ප්‍රතිලේඛණගත කිරීමේ සාකච්ඡා සිදුකරමින් පවතී.

**හිඟුරාන ඇග්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ්**

බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර පුනර්ජීවන ඒකක පිහිටුවීම සඳහා 2022 අංක 01 දරන ශ්‍රී ලංකා මහ බංකුවේ චක්‍රලේඛයේ මාර්ගෝපදේශ යටතේ ණය ගැණුම්කරුට ව්‍යාපාර පුනර්ජීවන පැකේජය ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව, සමාගම විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහය මත පදනම්ව, ගනුදෙනුකරුට නව පහසුකම් ලබා දී ඇත.

වී මෝල නැවත ආරම්භ

අදාළ ගනුදෙනුකරුවන්ට ණය ලබා දීමට පෙර බැංකුව විසින් සතුටුදායක ගනුදෙනුකරුවන් ගේ ඇගයීම් සිදු කර ඇති බවට සහතික විය යුතුය.

කිරීම සහ ඇස්තමේන්තුගත විකුණුම් සාක්ෂාත් කර ගැනීම සඳහා මුදල් ප්‍රවාහයක් ජනනය කිරීමේ අරමුණින්, සියයට 20 ක ස්කන්ධ දායකත්වයක් සහිතව සමාගම විසින් 2025 යල කන්නය සඳහා රු. මිලියන 310 ක වී උකස් ඇත.

පහසුකම් සමාලෝචනය කිරීම සඳහා සමාගම සමඟ ව්‍යාපාර පුනර්ජීවන සහ පුනරුත්ථාපන අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ සභාපතිත්වයෙන් යුත් අඛණ්ඩ සමාලෝචන රැස්වීම් පවත්වා ඇති අතර එකඟ වූ පරිදි පවතින ණය අඩු කරන ලෙස අඛණ්ඩව ඉල්ලා ඇත.

තවද, පවතින පහසුකම් අයකර ගැනීම සඳහා 2025.12.31 දින හෝ ඊට පෙර රු. මිලියන 200 ක් තැන්පත් කරන බව සමාගම ප්‍රකාශ කරමින් දැනටමත් ප්‍රතිඥා ලිපියක් සමාගම විසින් ඉදිරිපත් කර ඇත.

පුනර්ජීවන පැකේජය ක්‍රියාත්මක කර ඇතත්, මේ දක්වා ඇස්තමේන්තුගත පිරිවැටුම ළඟා කර ගැනීමට සමාගමට නොහැකි වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රතිලේඛණගත කරන ලද පහසුකම් එකඟ වූ පරිදි ගෙවීම් කර නොමැත.

**සුහද ලංකා හාඩ්වේයාර්**

තනිපුද්ගල ව්‍යාපාරයේ පාර්ශවකරු මිය ගොස් ඇත. බූදල් නඩුව විභාගවෙමින් පවතී. නඩුව අවසන් වූ පසු තෙවන පාර්ශවය දේපළ මිලදී ගැනීමට සහ සියලු පහසුකම් පියවීමට එකඟ වී

ඇත.

**නෝර්ත්වෙස්ට් මැරීන් ලැන්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

ගනුදෙනුකරු දේශීය හා අපනයන වෙළඳපොළට ෆයිබර් වීදුරු බෝට්ටු නිෂ්පාදනය කිරීමේ නිරත වේ. තහවුරු කරන ලද ඇණවුමට එරෙහිව බෝට්ටු නිෂ්පාදනය කිරීම සඳහා ණය ලබා දී ඇත. කෙසේ වෙතත්, විදේශීය ගැනුම්කරුගේ හිමිකරු මියගොස් ඇත. මිලදී ගැනීමේ සමාගම මුදල් නඩු ක්‍රියා පටිපාටියට භාජනය වී ඇති අතර නියමිත කාල සීමාව තුළ නිෂ්පාදනය කරන ලද බෝට්ටුව මිලදී ගැනීමට නොහැකි වී ඇත. එමඟින් පහසුකම් අක්‍රිය ණය වෙත මාරු කිරීමට හේතු විය. කෙසේ වෙතත්. දැන් පහසුකම ප්‍රතිලේඛණගත කර ඇති අතර ගෙවීම සතුටුදායකව සිදු වේ.

**කොලෙගා ඉංජිනේරු (ප්‍රයිවට්) ලිමිටඩ්**

ගනුදෙනුකරු මාර්ග සංවර්ධන අධිකාරියේ, ජල සම්පාදන මණ්ඩලයේ සහ කෘෂිකර්ම අමාත්‍යාංශයේ මාර්ග ව්‍යාපෘති ඉදිකිරීමේ නියැලී සිටී. ව්‍යාපෘතිවල කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා අදාළ ව්‍යාපෘතියේ අතුරු ගෙවීම් සහතිකවලට එරෙහිව කෙටි කාලීන ණය සීමාවක් ලබා දී ඇති අතර, ගනුදෙනුකරුට අපේක්ෂිත පරිදි ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට නොහැකි වූ අතර ගනුදෙනුකරු සහ ප්‍රතිලාභියා එකඟ වූ පරිදි ප්‍රගති ගෙවීම් ලංකා බැංකුවේ ගිණුම් හරහා ගනුදෙනු කර නොමැත.

එමඟින් පහසුකම් අක්‍රීය ණය වෙත මාරු කර ඇති අතර වර්තමානයේදී නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.

**ගාමිණී එන්ටර්ප්‍රයිසස්**

ගනුදෙනුකරු 2024.05.13 දින මිය ගොස් ඇත. ගනුදෙනුකරුගේ පාර්ශවය විසින් බූදල් නඩුව ගොනු කර ඇත. ඔහුගේ දේපළ සඳහා පරිපාලන බලපත්‍රය නිකුත් කිරීම සඳහා අවසන් අධිකරණ නඩු විභාග දිනය 2025.07.28 විය. ගනුදෙනුකරුගේ උරුමය විකිණීම සඳහා අධිකරණයෙන් අවසර ලබා ගැනීම සඳහා නීතිඥයින් විසින් ලිපි ලේඛන සකස් කරමින් පවතී. ඊළඟ අධිකරණ දිනය නොවැම්බර් පළමු සතියේ මෝසමක් මගින් පැවැත්වේ.

**කිවන් ඇන්ඩ් බෙඩ්රූම් (ප්‍රයිවට්) ලිමිටඩ්**

කිවන් ඇන්ඩ් බෙඩ්රූම් (ප්‍රයිවට්) ලිමිටඩ් 2018 වර්ෂයේදී පිහිටුවන ලද අතර අභ්‍යන්තර නිර්මාණ ව්‍යාපාරයේ නිරත වේ. නවීන මුළුතැන්ගෙයි සහ නිදන කාමර ගෘහ භාණ්ඩවල අවසාන නිෂ්පාදනය සඳහා ඔවුන් විශේෂයෙන් තුර්කියෙන් අමුද්‍රව්‍ය ආනයනය කරයි. විනිමය අනුපාතවල උච්චාවචනයන්, ඉදිකිරීම් කර්මාන්තයේ පසුබෑම සහ නුසුදුසු මිලකරණ යාන්ත්‍රණයන් හේතුවෙන් සමාගම මූල්‍යමය පසුබෑමකට මුහුණ දී තිබුණි. ණය ලබා දෙන අවස්ථාවේ අභ්‍යන්තර මිලකරණ උපාය

මාර්ගය පැවති බැවින්, සමාගමට තම සේවාදායකයින් සමඟ සාකච්ඡා කරන මිල මත පදනම්ව සියයට 50 ක අත්තිකාරමක් ලැබී ඇත. කෙසේ වෙතත්, විනිමය අනුපාතවල අහිතකර චලනය හේතුවෙන්, අමුද්‍රව්‍යවල පිරිවැය ඉහළ ගිය අතර එය අවසානයේ ආන්තිකයන් ඛාදනය කරමින් දැඩි මූල්‍ය පාඩු ඇති කරන ලදි. මෙම කරුණු ණය ආපසු ගෙවීම සඳහා ගනුදෙනුකරුට බලපෑ අතර අවසානයේ අක්‍රීය ණය වෙත මාරු කරන ලදි.

වාරිකය ගෙවීමට ගනුදෙනුකරුට නොහැකි වූ බැවින්, ප්‍රතිව්‍යුහගත කිරීමේ පහසුකමක් ලෙස ඌන ක්‍රියාකාරී පහසුකම් දෙකෙහි හිඟ ශේෂයන් අවශෝෂණය කර ගනිමින් එම පහසුකම ලබා දෙන ලදි.

2025.12.15 දිනට පෙර සියලුම හිඟ මුදල් පියවන ලෙසත්, ගනුදෙනුකරු පහසුකම පියවීමට අපොහොසත් වුවහොත් සුදුසු අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගන්නා බවත් බැංකුව ගනුදෙනුකරුට දැනුම් දී ඇත.

**පී.ඒ.ඩී.එම් ප්‍රියශාන්ත මහතා**

ගනුදෙනුකරු සංචාරක කර්මාන්තයේ නියැලී සිටී. ධාරිතාව වැඩි කිරීම සඳහා අමතර හෝටල් කාමර ඉදිකිරීම සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා ණය ලබා දී ඇත. කෙසේ වෙතත්, පාරිභෝගිකයා දැඩි සෞඛ්‍ය ගැටලුවකට මුහුණ දී ඇති අතර ව්‍යාපාරයේ නිරත

වීමට නොහැකි වී ඇත. දැනට ඔහු සුවය ලබමින් සිටින අතර 2025 දෙසැම්බර් 02 වන සතිය තුළදී සම්පූර්ණ හිඟ මුදල් පියවීමට එකඟ විය.

**කේ.එච්.පී සමරසිංහ මහත්මිය**

ණය ගැණුම්කරු කුකුළු ගොවිපල ව්‍යාපාරයක නියැලී සිටින නමුත් තාක්ෂණික ගැටළු හේතුවෙන් ව්‍යාපාරික කටයුතු නවතා දමා ඇත. ණය ගැණුම්කරු තම දේපළ විකිණීමෙන් 2025.12.31 දිනට පෙර පොලී සහන සහිතව පහසුකම් පියවීමට ශාඛාව සමඟ සාකච්ඡා කර ඇත.

(vii) පසුගිය වර්ෂ පහක කාලය තුළදී බැංකුව විසින් විවිධ අංශ සඳහා ලබා දී ඇති ණයවල අක්‍රීය ණය අනුපාත විශ්ලේෂණය කිරීමේදී, නිෂ්පාදන, ඉදිකිරීම්, තොග හා සිල්ලර වෙළඳාම සහ සංචාරක අංශවල අක්‍රීය අනුපාත තවමත් අනෙකුත් අංශ හා සසඳන විට සැලකිය යුතු අනුපාත ලෙස වාර්තා වී ඇති බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| අංශය | අක්‍රීය ණය අනුපාත (%) | | | | |
|---|---|---|---|---|---|
| | **2024** | **2023** | **2022** | **2021** | **2020** |
| නිෂ්පාදන | 18.34 | 20.29 | 23.44 | 18.73 | 20.13 |
| ඉදිකිරීම් | 16.57 | 18.19 | 16.87 | 11.72 | 13.40 |
| තොග හා සිල්ලර වෙළඳාම | 14.62 | 16.10 | 18.04 | 18.80 | 20.93 |
| සංචාරක | 14.03 | 11.69 | 7.85 | 3.49 | 3.93 |

**නිෂ්පාදන අංශය**

ආර්ථික ක්‍රියාකාරකම් ස්ථාපිත කිරීමත් සමඟ බැංකුවේ අක්‍රීය ණය අනුපාතය අඩු කිරීමේ ධනාත්මක ප්‍රවණතාවක් අංශය පෙන්නුම් කරයි. නමුත් 2021, 2022, 2023 කාල පරිච්ඡේදය තුළදී නිෂ්පාදන අංශය දැඩි අභියෝගවලට මුහුණ දෙන ලදි. අංශයට ලබා දී ඇති පහසුකම් පමා සහන ණය පහසුකම් යටතේ සලකනු ලැබ ඇති අතර එම කාලය තුළදී ඒවා කල් දැමීම් කිහිපයක් සිදු කර ඇත. රට තුළ කර්මාන්තයේ පවතින වර්ධනයත් සමඟ 2025 සිට ප්‍රවණතාවය වෙනස් කිරීමට අපේක්ෂා කෙරේ.

**සංචාරක අංශය**

පාස්කු ඉරිදා ප්‍රහාරය, කොවිඩ් 19 පැතිරීම සහ රටේ ආර්ථික අර්බුදය හේතුවෙන් සංචාරක අංශයට දැඩි බලපෑමක් එල්ල විය. බොහෝ

බැංකුවේ අක්‍රීය ණය අනුපාතය අඩු කිරීම සඳහා දැඩි අධීක්ෂණ සහ පසු විපරම් යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම සහ අයකර ගැනීමේ උත්සාහයන් වේගවත් කිරීම.

හෝටල් දිගු කාලයක් වසා දමා තිබූ අතර මුදල් ප්‍රවාහ අවම විය.

**ඉදිකිරීම් අංශය**

රටේ ආර්ථික අර්බුදය හේතුවෙන් රජයේ ඉදිකිරීම් ව්‍යාපෘති බොහොමයක් නතර කරන ලදි. නිම කළ බිල්පත් හරහා ඔවුන්ගේ හිඟ මුදල් පියවමින් මාර්ග සංවර්ධන අධිකාරිය, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යන ආයතන බොහෝ ව්‍යාපෘති අන්‍යෝන්‍ය වශයෙන් අවසන් කරන ලදි. කොන්ත්‍රාත්කරුවන්ට ශේෂ ගෙවීම් පමණක් ලැබුණු අතර ව්‍යාපෘති සඳහා ලබා දුන් පහසුකම් අක්‍රීය ණය වෙත මාරු කරන ලදි. වර්තමාන සන්දර්භය තුළ ද කර්මාන්තය මන්දගාමීව වර්ධනය වන අතර කලින් ලබා ගත් පහසුකම් සඳහා වන ගෙවීම් සතුටුදායක නොවේ.

**තොග හා සිල්ලර අංශය**

දී ඇති කාලපරිච්ඡේදය තුළදී අඛණ්ඩව ඉහළ අක්‍රීය ණය අනුපාත පෙන්නුම් කරන නමුත් රටේ ආර්ථිකයේ පිරිවැටුම සමඟ අක්‍රීය ණය අනුපාතවල පහත වැටීමේ ප්‍රවණතාවක් නිරීක්ෂණය කළ හැකිය.

(viii) **ලංකා බැංකුවේ චෙන්නායි ශාඛාවේ ගනුදෙනුකරුවන්ට ලබා දී ඇති ඉහළම අක්‍රීය ණය සහ අත්තිකාරම්**

**අ. ශ්‍රී රඝුවීර් ටිම්බර් ඇන්ඩ් ප්ලයිවුඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

චෙන්නායි හි මහා පරිමාණ ව්‍යාපෘති සඳහා දැව, ප්ලයිවුඩ්, ලැමිනේට් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන වෙළඳාම සහ බෙදා හැරීමේ නියැලී සිටින ශ්‍රී රඝුවීර් ටිම්බර් සහ ප්ලයිවුඩ්ස් ප්‍රයිවට් ලිමිටඩ්, 2012 සිට ශාඛාවෙන් පහසුකම් ලබා ගනිමින් සිටි අතර, කාලයත් සමඟ වැඩිදියුණු කිරීම් කිහිපයක් සිදු විය. 2021 මාර්තු 31 වන දිනට, පහසුකම් දෙකක්, එනම් ඉන්දියන් රු. මිලියන 8.32 ක මුදල් ණයක් සහ ඉන්දියන්රු. මිලියන 125 ක ඉල්ලුම් ණයක් අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර තිබුණි. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් සමාගමේ මෙහෙයුම් දැඩි ලෙස බලපෑමට

OTS දෙක මගින් පහසුකම පියවා වසා දමා ඇති අතර නව ඇපකරයක් මත පමණක් ඉන්දියන් රු. මිලියන 20 ක අමතර පහසුකමක් ලබා දී ඇත. මුළු හිඟ ඉන්දියන් රු. මිලියන 139.60 අතරින් ගනුදෙනුකරු විසින් ඉන්දියන් රු. මිලියන 111

අක්‍රීය ණය ගනුදෙනුකරුවන් අඩු කිරීම සඳහා දැඩි අධීක්ෂණ සහ පසු විපරම් යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම සහ අයකර ගැනීමේ උත්සාහයන් වේගවත් කිරීම.

| | | |
|---|---|---|
| ලක් වූ අතර, එම කාලය තුළදී ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2021 අප්‍රේල් දක්වා අක්‍රීය ණය වර්ගීකරණය තාවකාලිකව තහනම් කරන ලදි. පසුව, ශාඛාව 2021 දෙසැම්බර් මාසයේදී ඉන්දියන් රු. මිලියන 22.30 ක් කපා හැර තවත් ඉන්දියන් රු. 59,041 ක ප්‍රමාද වූ පොලිය අත්හැර තිබුණි. 2024 නොවැම්බර් 30 වන දිනට, සමාගමේ මුළු හිඟ මුදල ඉන්දියන් රු. මිලියන 198.32 ක් (රු. මිලියන 682.84) වූ අතර එයට ඉන්දියන් රු. මිලියන 139.66 (රු. මිලියන 480.86) ක ප්‍රාග්ධන කොටසක් සහ ඉන්දියන් රු. මිලියන 58.66 (රු. මිලියන 201.97) ක පොලියක් ඇතුළත් විය. මෙම පහසුකම් මුලින් නිශ්චල දේපළ තුනකට එරෙහිව සුරක්ෂිත කරන ලද අතර, ඉන් එක් වාණිජ දේපළක් අර්ධ වශයෙන් හිඟ මුදල් පියවීම සඳහා උපලබ්ධි කර ගන්නා ලද අතර, මාධවරම් සහ ආංගඩු ගම්මානවල හිස් ඉඩම් කොටස් දෙකක් (ආපදා වටිනාකම ඉන්දියන් රු. මිලියන 48.05 ක් සහ ඉන්දියන් රු. මිලියන 32 ක් වේ.) සුරැකුම් ලෙස ඉතිරිව ඇති අතර, ආවරණ අනුපාතය සියයට 40.37 ක් පමණක් සපයයි.<br>තවද, 2020 න් පසු තොග/ණයගැතියන් සඳහා රක්ෂණය අලුත් කිරීමට අපොහොසත් වීම, 2021 න් පසු විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම සහ 2020 න් පසු තොග/ලැබිය යුතු මුදල් ප්‍රකාශන නොමැති වීම ඇතුළු 2019 ණය අනුමැතියේ ප්‍රධාන කොන්දේසි සමඟ අනුකූල නොවීම් කිහිපයක් නිරීක්ෂණය විය. SARFAESI යටතේ නීතිමය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කර තිබූ අතර, 2024 මැයි 10 වන දින ණය ගැණුම්කරුට 13(4) දැන්වීමක් නිකුත් කර තිබුණි. | ක් ආපසු ගෙවා ඇති අතර ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ඉන්දියන් රු. මිලියන 20 ක (2025.03.11)<br>වටිනාකමකට වෙනම ඇපකරයක් ඇත. කොවිඩ් පමා සහන මත පොලී ස්වභාවයෙන් තිබූ ඉන්දියන් රු. මිලියන 8.3 ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව කපා හරින ලදි.<br>ශාඛාව විසින් ඉන්දියන් රු. මිලියන 75 ක ප්‍රතිපාදනයක් ආපසු හරවා ඇති අතර එය අවසාන ලාභයේ පිළිබිඹු වනු ඇත.<br>ආපසු ගෙවීමේ සැලැස්මට අනුව ගනුදෙනුකරු විසින් ඉන්දියන් රු. මිලියන 20 ක් වූ ප්‍රතිව්‍යුහගත කරන ලද ණය ගෙවමින් ඇත.<br>ශාඛාව විසින් 2020 වසර සඳහා රක්ෂණ ඔප්පුව යුනයිටඩ් ඉන්ඩියා ඉන්ෂුවරන්ස් සමාගම වෙතින් ලබාගෙන ඇති අතර 2020 වසර සඳහා තොග සහ ලැබිය යුතු මුදල් සමඟ විගණනය කරන ලද මූල්‍ය ලබාගෙන ඇත. කෙසේ වෙතත්, පහසුකම් අක්‍රීය ණය වෙත මාරු කිරීමෙන් පසු, බැංකුව ඉල්ලීම් කළද ගනුදෙනුකරු පසුව මූල්‍ය තොරතුරු ලබා දී නොමැත. | |
| **ආ. කේ.ආර්.එම් හෝම් මේකර්ස් ප්‍රයිවට් ලිමිටඩ්**<br>සිවිල් ඉංජිනේරු සහ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියැලී සිටින කේ.ආර්.එම් හෝම් මේකර්ස් ප්‍රයිවට් ලිමිටඩ් වෙත මහල් නිවාස 99 කින් යුත් මහල් නවයක නේවාසික ව්‍යාපෘතියක් සඳහා 2015 නොවැම්බර් 09 වන දින චෙන්නායි ශාඛාව විසින් ඉන්දියන් රු. මිලියන 190 ක මුදල් ණය පහසුකමක් අනුමත කර තිබුණි. 2020 දී නිම කිරීමට නියමිත මෙම ව්‍යාපෘතිය, කොවිඩ් 19, විකුණා නොමැති මහල් නිවාස, ඉදිකිරීම් පිරිවැය ඉහළ යාම, මිල ඉහළ යාම, ජනවිකාස වෙනස්කම් සහ විරැකියාවේ කම්පන හේතුවෙන් ප්‍රමාද වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2020 මාර්තු 31 | බැංකුවේ නීති උපදේශකයාගේ උපදෙස් අනුව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කරන ලදි.<br>2002 SARFAESI පනතේ 14 වන වගන්තිය යටතේ දේපළ අත්පත් කර ගැනීම සඳහා දිස්ත්‍රික් මහේස්ත්‍රාත් / ප්‍රධාන මෙට්‍රොපොලිටන් මහේස්ත්‍රාත් වෙත අයදුම්පතක් ගොනු කිරීමට | අක්‍රීය ණය ගනුදෙනුකරුවන් අඩු කිරීම සඳහා දැඩි අධීක්ෂණ සහ පසු විපරම් යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම සහ අයකර ගැනීමේ උත්සාහයන් වේගවත් කිරීම. |

| | |
|---|---|
| වන දින පහසුකම අක්‍රිය ණය ලෙස වර්ගීකරණය කර තිබුණි. 2024 නොවැම්බර් 30 වන දිනට, හිඟ මුදල ඉන්දියන් රු. මිලියන 145.02 ක් වූ අතර, එයට රු. මිලියන 104.38 ක ප්‍රාග්ධන කොටසක් සහ ඉන්දියන් රු. මිලියන 40.64 ක පොලියක් ඇතුළත් විය. මෙම ණය මුදල අම්බතූර් තාලුක් හි මාධවරම් ගම්මානයේ පිහිටි ඉඩමෙන් සියයට 69.77 ක කොටසක් මගින් සුරක්ෂිත කර තිබූ අතර එය සියයට 76.33 ක ආවරණයක් සහිතව ඉන්දියන් රු. මිලියන 500 ක් ලෙස තක්සේරු කර තිබුණි. කෙසේ වෙතත්, දේපල හිමිකරු සහ සමාගම අතර ඇති ආරවුල් හේතුවෙන් අයකර ගැනීම්වලට බාධා එල්ල වී තිබූ අතර, ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර අධිකරණයේ අත්හිටුවීමේ නියෝගයක් ලබා ගැනීමේ පෙත්සමක් ගොනු කර තිබුණි. බැංකුව විසින් 2024 නොවැම්බර් 22 වන දින අධ්‍යක්ෂවරුන්ට සහ ඇපකරුවන්ට දැනුම් දී තිබූ අතර ඉදිරි ක්‍රියාමාර්ග සඳහා නීති උපදේශකයින් සමඟ සම්බන්ධීකරණය කරමින් සිටී. | ශාඛාව කටයුතු කරමින් සිටී.<br>අවසාන තීන්දුව සඳහා ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම සම්බන්ධයෙන්<br>අධ්‍යක්ෂවරුන් සහ ඉඩම් හිමියන් අතර ඇති ආරවුල ඉන්දියාවේ<br>ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී. තීන්දුව ලද පසු දෙපාර්ශ්වයම ඒ අනුව ක්‍රියා කළ යුතු අතර එය බැංකුවේ පාලනයෙන් බැහැරව පවතී. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | 1938 අංක 53 දරන ලංකා බැංකු ආඥා පනත | 2024 සැප්තැම්බර් 23 සිට 2024 නොවැම්බර් 03 දක්වා කාලය තුළදී සභාපතිවරයෙකු පත් කර නොතිබුණි. | සටහන් කර ගන්නා ලදි. 1938 අංක 53 දරන ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධන ප්‍රකාරව බැංකුව අයත් වන අමාත්‍යවරයා විසින් සභාපතිවරයා පත් කරනු ලබයි. | ලංකා බැංකු ආඥාපනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වීමට නිර්දේශ කෙරේ. |
| (ii) | 2024 සැප්තැම්බර් 11 වන දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2024 අංක 03 දරන බැංකු පනතේ නියෝගය | 1938 අංක 53 දරන ලංකා බැංකු ආඥා පනතට සහ එහි සංශෝධනවලට අනුව, ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසර ලත් අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව හය දෙනෙකි.<br>2024 වර්ෂය තුළදී, අධ්‍යක්ෂ මණ්ඩලය 4 සිට 6 දක්වා පරාසය තුළ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගෙන් සමන්විත වූ අතර එය ඉහත නියෝගයට අනුකූල නොවීය. | ලංකා බැංකු ආඥා පනත සංශෝධනය කිරීම දැනට ක්‍රියාත්මක කරමින් පවතින අතර බැංකුවේ පාලනයෙන් බැහැර වේ. සංශෝධනය අවසන් වූ පසු ගැටළුව විසඳනු ඇත.<br>කෙසේ වෙතත්, අධ්‍යක්ෂවරුන් පත් කිරීම සම්බන්ධයෙන් 2024 අංක 03 දරන ශ්‍රී ලංකා මහ බැංකුවේ තීරණයට අනුකූල වීම මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර බැංකුව විසින් සිදු කළ යුතුය. | ආයතනික පාලන නියෝගවල අවශ්‍යතාවයන්ට අනුකූල වීමට නිර්දේශ කෙරේ. |
| (iii) | 2019 ඔක්තෝබර් 15 වන දින පැවති රැස්වීමකදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් | බැංකුවේ ප්‍රසම්පාදන කමිටුව පහත සඳහන් අවශ්‍යතාවලට අනුකූල වී නොතිබුණි.<br>- ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීම.<br>- අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් සඳහා අපේක්ෂා කරන ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්. | නිවැරදි කරන ලදි.<br>2025 වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම (MPP) සහ සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කර ඇති අතර 2025.06.27 දින පැවති රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදි. (අධ්‍යක්ෂ මණ්ඩල | අදාළ නියෝගයට අනුකූල වීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | සංශෝධනය කරන ලද 2014 ලංකා බැංකුවේ ප්‍රසම්පාදන අත්පොතේ 4.2.1, (අ, ආ, ඇ, සහ ඈ) වගන්ති. | - ඊළඟ වර්ෂය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් විස්තරාත්මකව පිළියෙල කිරීම.<br>- මාස හයකට නොඉක්මවන නිතිපතා යාවත්කාලීන කරන ලද ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම. | රැස්වීම් සටහන: 11.6.01/27.06.2025). 2025.09.26 දින 2025 සඳහා සමාලෝචනය කරන ලද MPP සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී.<br>ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ ප්‍රසම්පාදන අත්පොතට අනුකූලව, බැංකුව විසින් 2026 සිට 2028 දක්වා වර්ෂ තුනක කාලයක් සඳහා MPP සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී. මුදල්, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් අනුව, තුන් අවුරුදු ප්‍රසම්පාදන සැලැස්ම (2026-2028) අනුමැතිය සඳහා 2025.11.30 දිනට පෙර අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ඇත. | |
| (iv) | 2021 දෙසැම්බර් 09 දිනැති ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී බැංකු සඳහා තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ නියාමන රාමුව. | 5.3.1-1 තීරණාත්මක තොරතුරු පද්ධති සහ ගනුදෙනුකරුවන්ගේ දත්තවලට නිරාවරණය වන තොරතුරු පද්ධතිවල පරිගණක ආරක්ෂාව සහ පරිශීලක ක්‍රියාකාරකම් ලොග් කළමනාකරණය කිරීමට බලපත්‍රලාභී බැංකු විසින් 5.3.2 සිට 5.3.7 දක්වා අවශ්‍යතාවලට අනුකූලව පරිගණක ආරක්ෂාව සහ පරිශීලක ක්‍රියාකාරකම් ලොග් කළමනාකරණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ යුතුය. එවැනි ප්‍රතිපත්තියක් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතය පරිදි අනෙකුත් තොරතුරු පද්ධති වෙත ද ව්‍යාප්ත කළ හැකිය.<br>5.3.2 - නඩත්තු කළ යුතු ලොග් වර්ග, රඳවා ගැනීමේ කාලය, සමාලෝචන වාර ගණන, සමාලෝචන ක්‍රමය සහ භාවිතා කළ යුතු මෙවලම්, සිදුවීම් හඳුනා ගැනීම හා ප්‍රතිචාර දැක්වීම සහ ලොග් නඩත්තු කිරීම හා සමාලෝචනය කිරීම සඳහා වගකීම් ප්‍රතිපත්තියට ඇතුළත් විය යුතුය.<br>5.3.7 – අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ (BIRMC) සහ තොරතුරු ආරක්ෂක කමිටුවේ (ISC) නිර්දේශ මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතිපත්තිය අනුමත කළ යුතුය. | පහත ප්‍රතිපත්ති මගින් ආවරණය කෙරේ.<br>i) 5.3.1 - ලංකා බැංකු - IIRMD - POL-016- දුරස්ථ ප්‍රවේශ ආරක්ෂක ප්‍රතිපත්තිය (නිකුත් කරන ලදී.)<br>ii) 5.3.2 - ලංකා බැංකු - IIRMD - POL-026- ක්ලවුඩ් පරිගණක ප්‍රතිපත්තිය (කෙටුම්පත)<br>iii) ලංකා බැංකු - IIRMD-POL-010 - ජාල ආරක්ෂාව සහ භාවිත ප්‍රතිපත්තිය (නිකුත් කරන ලදී.)<br>කැපවූ "පරිගණක ආරක්ෂාව සහ පරිශීලක ක්‍රියාකාරකම් ලොග් කළමනාකරණ ප්‍රතිපත්තියක්" කෙටුම්පත් කර ඇති අතර අදාළ පාර්ශවකරුවන්ගේ අදහස් සමඟ අවසන් කරනු ඇත. | අදාළ නියෝගවලට අනුකූල වීමට කටයුතු කළ යුතුය. |

බැංකුව තුළ ක්‍රියාකාරකම් ලොග් කළමනාකරණය පිළිබඳ ප්‍රතිපත්ති නොමැති බවත් ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කර නොමැති බවත් නිරීක්ෂණය කරන ලද අතර එය "බලපත්‍රලාභී බැංකු සඳහා තාක්ෂණ අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ නියාමන රාමුව" සමඟ අනුකූල නොවීමට හේතු වේ.

## 1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ (IRD) තහවුරු කිරීමකට අනුව, 2024 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ මුළු බදු වගකීම රු. මිලියන 5,205.45 ක් විය. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල බැංකුව විසින් රු. බිලියන 4.086 ක ප්‍රතිපාදනයක් සිදු කර තිබුණි. | බැංකුවේ වාර්තාවලට අනුව, තක්සේරු කිරීම්වලට අදාළ බදු වගකීම රු. 4,086,250,806 ක් (ගෙවිය යුතු පොලිය ඇතුළත් වන අතර ගෙවිය යුතු දඩ මුදල ඇතුළත් නොවේ.) වන අතර එය විගණන වාර්තාවේ සඳහන් රු. 5,205,451,254 ට වඩා වෙනස් වේ. තථ්‍ය බදු වගකීමට අනුකූලව, දඩ මුදල් හැර බැංකුව විසින් මේ දක්වා මූල්‍ය ප්‍රකාශනවල රු. 4,086,250,806/- ක ප්‍රතිපාදනයක් සිදු කර ඇත. කෙසේ වෙතත්, අපගේ වාර්තා මත පදනම්ව පහත විෂමතා හඳුනාගෙන ඇත.<br>2019/2020 තක්සේරු වර්ෂය සඳහා මූල්‍ය සේවා සඳහා වැට් බදු සඳහා නව තක්සේරුවක් 2022 දෙසැම්බර් 28 වන දින නිකුත් කරන ලද අතර දඩ මුදල් හැර ගෙවිය යුතු බද්ද රු. 189,153,717 ක් විය යුතුය. ඒ අනුව, තක්සේරුව නොසැලකිලිමත් ලෙස ගෙවිය යුතු බදු සඳහා සලකා බලා ඇති බව නිරීක්ෂණය වී ඇත.<br>දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය නිකුත් කිරීමත් සමඟ, 2016/2017 වර්ෂය සඳහා ආදායම් බදු සඳහා වන කාරණය, බදු අභියාචනා කොමිසමට අභියාචනා කරන ලද අතර 2021 මැයි 11 දිනැති IRD ලිපියට අනුව, ගෙවිය යුතු බද්ද රු. 652,213,542 ක් විය යුතුය.<br>2015/2016 වර්ෂය සඳහා ආදායම් බද්ද සඳහා ගෙවිය යුතු බද්ද, 2012/2013 තක්සේරු වර්ෂය සඳහා ඉදිරියට ගෙන එන ලද ආපසු ගෙවිය හැකි රු. 198,894,244 ක මුදලට එරෙහිව හිලව් කර ඇති බවත්, ඉතිරි රු. 10,910,850/- ක මුදල රඳවා ගැනීමේ බදු බැර බවත් සැලකිය යුතුය. ඒ අනුව, බැංකුව මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොමැත.<br>IRD වෙතින් ලැබිය යුතු රඳවා ගැනීමේ බදු බැර සම්බන්ධයෙන් 2019/2020 තක්සේරු වර්ෂය සඳහා බදු අභියාචනා කොමිසමේ තීරණය අපේක්ෂාවෙන් සිටී. එබැවින්, මේ සම්බන්ධයෙන් බැංකුව විසින් කිසිදු ප්‍රතිපාදනයක් හඳුනාගෙන නොමැත.<br>තවද, 2020/2021 තක්සේරු වර්ෂය සඳහා | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් ප්‍රතිපාදන සැලසීමට කටයුතු කළ යුතුය. |

රු. 779,681,406 ක ආදායම් බදු වගකීම අඩු කරන ලද අතර හිඟ ශේෂය රු. 404,319,230 ක් ලෙස වෙනස් කළ යුතුය.

### 1.9 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

### 1.9.1 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රමවල අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අන්තර්ජාල බැංකුකරණය, හිනැකල් ට්‍රෙෂරි, IFRS, DMS, FTI, MCS Inward, MCS Outward, Base24, ප්‍රයිම්4, ICBS, T4s පද්ධති සඳහා පද්ධතියෙන් ජනනය කරන ලද වෙනස් කිරීමේ ලොගයක් බැංකුව විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. | අන්තර්ජාල බැංකුකරණය/හිනැකල් ට්‍රෙෂරිස් /IFRS/**ප්‍රයිම්**4 **-** පද්ධතියෙන් ජනනය කරන ලද වෙනස් කිරීමේ ලොග් නඩත්තු කිරීමේ හැකියාවක් පද්ධතියට නොමැත.<br><br>DMS - FileNet හි ලොගින් වීම හා විගණන සැකසුම් පරීක්ෂා කිරීම සහ පද්ධති ක්‍රියාකාරිත්වයට බලපෑම් කිරීමෙන් තොරව සියලුම සිදුවීම් ලොග් සක්‍රීය කිරීමේ ශක්‍යතාව ඇගයීමට අවශ්‍ය වේ.<br><br>MCS Inward/MCS Outward - අධීක්ෂණය සඳහා යෙදුම උසස් කිරීම සහ ඒකාබද්ධ කිරීම කළ යුතුය.<br><br>Base24 **-** පද්ධති යටිතල පහසුකම් හේතුවෙන්, Base24 වෙතින් ඉල්ලා සිටින වෙනස් කිරීමේ ලොග් වර්ගය උපුටා ගැනීමට අපට නොහැකි වේ.<br><br>T4s - පද්ධති යටිතල පහසුකම් හේතුවෙන්, T4S යෙදුම වෙතන් ඉල්ලා සිටින වෙනස් කිරීමේ ලොග් වර්ගය උපුටා ගැනීමට අපට නොහැකි වේ. | පද්ධතියෙන් ජනනය කරන ලද වෙනස් කිරීමේ ලොගයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | බැංකුව තුළ සිදුවන සිදුවීම් වාර්තා කිරීම සඳහා භාවිතා කරන තයිකොටික් ඩෙල්හිනියා මෙවලම සහ BTracker මෙවලම කළමනාකරණය කිරීම සහ භාවිතා කිරීම සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOP) නොතිබුණි. | සිදුවීම් කළමනාකරණය සඳහා SOC සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි භාවිතා කරයි. PAM සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියක් නිර්මාණය කරමින් පවතී. | සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි හඳුන්වා දීමට කටයුතු කළ යුතුය. |

<table>
<tr><td>(iii)</td><td>ICBS, T4s, ප්‍රයිම්4, Base24, MCS Inward, MCS Outward, පිනැකල් ට්‍රෙෂරි, වෙළඳ මූල්‍ය, DMS, අන්තර්ජාල බැංකුකරණය සහ IFRS පද්ධති සඳහා පූර්ව ක්‍රියාත්මක කිරීමේ ආරක්ෂක පරීක්ෂණ නොමැති වීම.<br>මූල්‍ය කාලපරිච්ඡේදය තුළදී ICBS, T4s, ප්‍රයිම්4, Base24, MCS Inward, MCS Outward, පිනැකල් ට්‍රෙෂරි, වෙළඳ මූල්‍ය, DMS, අන්තර්ජාල බැංකුකරණය සහ IFRS පද්ධති සඳහා සිදු කරන ලද සියලුම වෙනස් කිරීම් ක්‍රියාත්මක කිරීම් සඳහා බැංකුව පූර්ව ක්‍රියාත්මක කිරීමේ ආරක්ෂක පරීක්ෂණ සිදු කර නොතිබුණි.</td><td>අන්තර්ජාල බැංකුකරණය, සේවාදායකය දෘඪකරණය (server hardening), VAs වැනි විසඳුම් සඳහා පූර්ව ආරක්ෂණ පරීක්ෂණ සිදු කරනු ලබන අතර, PTs සඳහා බාහිර පාර්ශ්වයකට ලබා දී ඇත. බැංකුව 2025.12.31 වන විට ආරක්ෂණ ආශ්‍රිත කටයුතු සඳහා කළමනාකරණය කළ සේවා අනුමත කර ඇත.</td><td>අවශ්‍ය වූ විට ක්‍රියාත්මක කිරීමට පෙර ආරක්ෂණ පරීක්ෂණ සිදු කිරීමට කටයුතු කළ යුතුය.</td></tr>
<tr><td>(iv)</td><td>"තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති (අනුවාදය 7.0)" ලේඛනයේ අර්ථ දක්වා ඇති මුරපද ආරක්ෂක පරාමිතීන් නොමැති වීම.<br>"තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති (අනුවාදය 7.0)" ලේඛනයේ පහත මුරපද පරාමිතීන් අර්ථ දක්වා නොතිබුණි.<br>• අවම මුරපදයේ දිග<br>• මුලින් ලොග් වන පරිශීලකයාට එක් වරක් භාවිතා කළ හැකි මුරපදයක්<br>• බලකල මුරපදය වෙනස් කිරීමේ වාර ගණන<br>• නැවත මුරපදයක් භාවිතා කිරීමට පෙර භාවිතා කළ යුතු මුරපද ගණන<br>• අගුළු දැමීමට පෙර අවසර දී ඇති අසාර්ථක ලොග්වීමේ උත්සාහයන් ගණන<br>• පරිශීලකයින්ට තමන්ගේම මුරපද පැවරීමේ හැකියාව<br>• මුරපද සංකීර්ණතාව</td><td>2025.12.31 වන විට සමහර පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම හෝ උසස් කිරීම අවශ්‍ය වේ.</td><td>තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති අනුවාදය 7.0 උසස් කිරීමට කටයුතු කළ යුතුය.</td></tr>
<tr><td>(v)</td><td>Base24 පද්ධතිය, MCS outward පද්ධතිය සහ සක්‍රිය නාමාවලියේ ක්‍රියාකාරී නමුත් භාවිතා නොකළ පරිශීලක ගිණුම් පැවතීම.<br>Base24 පද්ධතිය, MCS outward පද්ධතිය සහ සක්‍රිය නාමාවලියේ ක්‍රියාකාරී නමුත් භාවිතා නොකළ පහත සඳහන් පරිශීලක ගිණුම් පවතී.<br><u>ක්‍රියාකාරී නමුත් භාවිතා නොකළ පරිශීලක ගිණුම්</u><br><u>Base24 පද්ධතිය</u>
<table>
<tr><th>Base24 පද්ධතිය</th><th>දෙපාර්තමේන්තුව</th><th>අවසානයට ලොග් වූ දිනය</th><th>තත්ත්වය (සටහන)</th></tr>
<tr><td>PF139401</td><td>SEC-IT139401</td><td>2021/12/15</td><td>THAWED</td></tr>
<tr><td>PF203810</td><td>SEC-IT203810</td><td>2023/11/22</td><td>THAWED</td></tr>
</table>
